*2017 ජනවාරි මස 10 අඟහරුවාදා දින*
*2017 ஜனவரி மாதம் 10 ஆம் திகதி செவ்வாய்க்கிழமை* **Tuesday 10th January 2017**

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
----------------

සියළුදෙනාටම සුභ උදෑසනක් වේවා ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඒ වගේම ගරු අමාත්‍යතුමන්ලා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, විපක්ෂනායකතුමා ප්‍රමුඛ මේ අවස්ථාවට සහභාගී වෙන ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. අද දිනට න්‍යාය පත්‍රානුකූලව මෙම සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා න්‍යාය පත්‍රානුකූලව පළමුවෙන්ම තිබෙන්නේ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් දීම් : නැත**

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ : නැත**

**ගරු සභාපතිතුමාගේ නිවේදන :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
----------------

අද දින සභා ලේකම් කාර්යාලය සඳහා ගරු ආණ්ඩුකාරතුමා, ඒ වගේම ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් නව වෙබ් අඩවිය එළිදැක්වීමේ කටයුත්ත ක්‍රියාත්මක කළා. ඒ සඳහා ඒ වෙබ් අඩවිය පිළිබඳ ලිපිනය තමුන්නාන්සේලා සියළුදෙනාටම ලැබෙන්න සළස්වලා තියනවා. ඒ අනුව මින් ඉදිරියට සභා ලේකම් කාර්යාලයේ වෙබ් අඩවිය සඳහා තමුන්නාන්සේලාට අවශ්‍ය තොරතුරු, ඒ අවශ්‍ය අධ්‍යාපන කාරණා ඉෂ්ට කරගන්නට කටයුතු නිර්මාණය කරලා තියනවා කියන එක මෙම ගරු සභාවට බොහොම සතුටින් දැනුම් දෙනවා. විශේෂයෙන්ම අපේ නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමා එහෙම පහුගිය අයවැය විවාදයේ දී මේ පිළිබඳව මතක් කරන්නට යෙදුනා. ඒ අනුව ඔබ තමුන්නාන්සේලා කරපු ඒ ඉල්ලීම අද ඉෂ්ට කරන්නට කටයුතු කරපු බව සතුටින් සභාවට මේ අවස්ථාවේ දී දැනුම් දෙනවා.

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

ගරු අමාත්‍ය ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.

ගරු මන්ත්‍රී කනපති රාමචන්ද්‍රන් මැතිතුමා.

ගරු මන්ත්‍රී ජයතිස්ස රණවීර මැතිතුමා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

නම් ඉදිරිපත් කරන ලද ගරු මැති ඇමතිතුමන්ලා සඳහා නිවාඩු අනුමත වෙනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

2015 වර්ෂයේ සබරගමුව පළාත් සභාවේ කාර්යය සාධන වාර්තාව සභාගත කරනවා. එය තමුන්නාන්සේලාට අපි ලැබෙන්න සළස්වනවා. එය තමුන්නාන්සේලාගේ දැන ගැනීම සඳහා ඔබතුමන්ලාගේ මේසය මත තබා තිබෙන බව දැනුම් දෙනවා.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම : නැත**

**පෙත්සම් : නැත**

**ප්‍රශ්න:**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

ගරු අජිත් කුමාර මැද්දේගම මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 6/1/2016/14 දරණ ප්‍රශ්නයට පිළිතුරු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව තියනවා.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ*
*அமைச்சர் அதுல குமார ராஹூபத்த* *Hon. Minister*
*Athula Kumara Rahubadda*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, 2016 වර්ෂයේ පළාත් මාර්ග නඩත්තුව සඳහා මධ්‍යම රජයෙන් ලැබුණ මුදල මිලියන 375 යි. ඒ වගේම දිස්ත්‍රික්කයේ වර්ග කිලෝ මීටර් ප්‍රමාණය මේ තුළ නිමා කරලා තියන 327.24 යි. ඒ වගේම විධායක ඉංජිනේරු කාර්යාලයේ මේ සඳහා දුර කිලෝ මීටර් පැල්මඩුල්ල 65 යි. සංඛ්‍යාව 15 යි. රත්නපුර විධායක ඉංජිනේරු කාර්යාලය කිලෝ මීටර 135.46 යි. ප්‍රමාණය 52 යි. බලන්ගොඩ කිලෝ මීටර් ප්‍රමාණය 41.87 යි. සංඛ්‍යාව 30 යි. ඇඹිලිපිටිය 78.87 යි. සංඛ්‍යාව 86 යි. කලවාන 6.00 යි. සංඛ්‍යාව 4 යි.

ඒ වගේම මාර්ග නඩත්තුව හරහා දිස්ත්‍රික්කයේ ග්‍රාමීය සංවර්ධනය සඳහා මිලියන 208 යි. ලේකම් කොට්ඨාශ අනුව රත්නපුරට 9 යි. පැල්මඩුල්ලට 27 යි. නිවිතිගලට 2 යි. ඇහැලියගොඩට 4 යි. වැලිගෙපොලට 1 යි. බලන්ගොඩට 1 යි. ඇඹිලිපිටියට 71 යි. ගොඩකවෙලට 2 යි. කුරුවිටට 43 යි. ඒ අනුව ඒ ඒ දිස්ත්‍රික්කවල තෝරාගත්ත ආයතන තියනවා. ක්‍රමවේද

විමසීමකට ලක් කරලා තියනවා. ටෙන්ඩර් ප්‍රදානයන්, ඩෙක්මා ආයතනය, ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ස්වෙච්ඡා සමිති සමාගම්. දෙවනි ප්‍රශ්නය.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ---------------
-------------------------------------------

පළවෙනි ප්‍රශ්නයේ ඔබතුමාට ගැටළු තියනවාද ?

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார* *Hon.Member*
*Ajith Kumara* -------------
--------------------------------------------

මේක ලිඛිතව දෙනවාද ?

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ*
*அமைச்சர் அதுல குமார ராஹூம்பத்த* *Hon. Minister*
*Athula Kumara Rahubadda*
-----------------------------------------------------------

නෑ....ලිඛිතව දෙන්නේ නෑ. ඔබතුමා වාචිකව අහලා තියෙන්නේ. ලිඛිතව ඉල්ලුවා නම් ලිඛිතව දෙන්න තිබුණා. වාචිකව ඉල්ලපු හින්දා වාචිකව දෙනවා. දෙවන ප්‍රශ්නයට උත්තර.

වෙළහපොල, ගල්කන්ද, ඕපනායක මාර්ගය කාපට් කර ඇති කොටස සම්බන්ධයෙන්. ඒ වගේම එතුමා විමසීමක්

කළා මාකඳුර ප්‍රධාන මාර්ගය සහ ඒ මාර්ගයේ අම්මඩුව මේ ආශ්‍රිතව තියන ප්‍රධාන මාර්ගයේ කොටසක් පමණක් සංවර්ධනය කළේ ඇයි කියන කාරණාව තමයි ඇහුවේ. මම හිතන්නේ එතුමා ඒ කාලයේ පාර්ලිමේන්තුවේ හිටියේ. පළාත් සභාවේ නෙමෙයි හිටියේ. පළාත් සභාවේ හිටපු මැති ඇමතිවරු දන්නවා මාදම්පේ හන්දියට තමයි ඉස්සෙල්ලාම ආවේ ටයර් ටික පුච්චන්න. මේ පාර හැදුවේ ඇයි කියන එකට පළවෙනි අවශ්‍යතාවය වුනේ ප්‍රධාන වශයෙන් මාදම්පේ හන්දියේ මාකඳුර දක්වා යන ප්‍රධාන මාර්ගයේ පාර අබලන් වී ඇති නිසා මාර්ගය සකස් කරලා දෙන්න කියලා. පළවෙනි අදියර වගේ මතකයේ හැටියට 2013 හේ 14 වගේ. ඒ කාල සීමාවල්වල අපි ඒකට අවශ්‍ය කරන එදා ඒ සහයෝගය ලබාදුන්නා. ඉන් අනතුරුව අම්මඩුව දේවාලයේ පෙරහැර සහ ඒ ආශ්‍රිතව ප්‍රධාන මාර්ගයේ 2014 හෝ 13 ඒකෙත් අවශ්‍ය කාරණාව කළා. ඉන් අනතුරුව ඔබතුමා විමසීමකට ලක් කළේ දැන් හැදෙන ප්‍රදේශයේ ඒ ප්‍රදේශයට පමණක් ඇයි සීමා වුනේ කියලා.

ඉතින් මේ එකම මාර්ගය තමයි වසරකට වතාවක් එක අදියරක් පමණක් හදන්න දෙන චක්‍රලේඛණය අනුව අදියරෙන් අදියර ගරු මන්ත්‍රීතුමා මේ මාර්ගය සකස් කරලා දීලා තියෙන්නේ. ඉන් අනතුරුව හදලා දීලා තියන මාර්ග ටික ඔබතුමා දන්නවා. අයවැය විවාදයේ දීත් ඔබතුමා ඇහුවා, ඒ වගේම ප්‍රශ්න කළා මුහුණ නැති ප්‍රශ්න. ඒ වගේම ඒක වෙනත් සංවිධායකවරුන්ට බැර කරන ප්‍රශ්න. ඉතින් ඒවා දේශපාලන කාරණා. ඒ විදිහට මේ පාරවල් දෙකේ අවශ්‍ය වාචික පිළිතුරු ලබාදෙනවා ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

ස්තූතියි ! ගරු ඇමතිතුමා.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார* *Hon.Member*
*Ajith Kumara* --------------
--------------------------------------------

ගරු සභාපතිතුමනි, මම මතක් කළේ වෙළහපොල ඒ කියන්නෙ වේරහැර අම්මඩුව පාරේ වෙළහපොල කොටස ඉතාම අබලන්. මම හිතන්නේ අපේ රංජිත් බණ්ඩාර ඇමතිතුමාත් ඒ පාරේ ගියා. ඔබතුමාත් මම හිතන්නේ ඒක පුද්ගලිකවම දන්නවා. ඒ පාර තමයි මූලිකම පාර කෙරෙන්න ඕන. ඇස්තමේන්තුවකුත් සකස් කරලා තියනවා කියන එක මට දැන ගන්න ලැබුණා. නමුත් ඒක පටන් ගත්තේ නෑ. ඒක ඉතාම දුර්වල තත්ත්වයේ තියෙන්නේ.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ*
*அமைச்சர் அதுல குமார ராஹூபத்த* *Hon. Minister*
*Athula Kumara Rahubadda*
-----------------------------------------------------

මේ වසර තුළ අපට දෙන්න බැරි හේතුව මේ සභාව දන්නවා. ඒකට ඉල්ලීමක් කරනවා ගරු මන්ත්‍රීතුමාගෙන්ම අපට අපේ පසුගිය වර්ෂයේ මුදල් ටික 32% ක ප්‍රමාණයක් විතර තමයි අපට ලැබිලා තියෙන්නේ. ඉතින් ඒ නිසා විශාල මුදලක් අපට එන්න තියනවා. ඒ මුදල අපට ලබාදුන්නා නම් මේ වර්ෂයේ මැද වෙන්න

ඉස්සෙල්ලා ඔබතුමාගේ යෝජනාවට ප්‍රතිපාදන දෙන්න පුළුවන්. කඩිනමින් ඒ මුදල් ටික පළාත් සභාවට එන්න කිව්වා නම් හරි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

ස්තූතියි ! ගරු අතුල කුමාර රාහුබද්ධ මැතිතුමාට. ඊළඟට ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්* *கௌரவ*
*உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.Member*
*M.Y.M.Iflar* --------
---------------------------------

ගරු සභාපතිතුමනි, ඊළඟ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා සබරගමුව පළාත් සභාව තුළ මේ වෙනවිට සේවයේ නියුතුව සිටින ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය සම්බන්ධයෙන් අහන ප්‍රශ්නයක් මම සභාගත කරනවා. අනෙක් එක ගරු සභාපතිතුමනි, පළාත් මාර්ග අමාත්‍යතුමාගෙන් ප්‍රශ්න ඇසීම සඳහා ඇතුළත් කිරීමට අවිධිමත් ලෙස කාපට් කිරීම සඳහා දම්බුළුවන, කහවත්ත ග්‍රාම නිළධාරී වසමේ කෝට්ටබන්ධාව කන්ද පාමුල සිට ගලතුර දක්වා මාර්ගයේ තාර දැමීමේ අවිධිමත් කාරණාව සම්බන්ධයෙන් සභාගත කරනවා. මේ සම්බන්ධයෙන් පිළිතුරක් ඊළඟ සභාවේ දී ලිඛිතව ලබාදෙන ලෙස.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* Hon.Chairman
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

ස්තුතියි ! ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමනි.

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ : නැත**

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* Hon.Chairman
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක හර්ෂ සියඹලාපිටිය මැතිතුමා.

*ගරු ආ.ප.සංවිධායක හර්ෂ සියඹලාපිටිය*
*கௌரவ அரச.க.அமைப்பாளர் ஹர்ஷ சியம்பலாபிடிய* Hon.Gov.Whip
*Harsha Siyambalapitiya* --------------
------------------------------------------

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාව ඔබතුමාගෙන් ඉල්ලා ගත්තේ මම නියෝජනය කරන ගලිගමුව ආසනයේ පදිංචි මලිති ශෂිකලා දිල්හානි දියණිය පසුගිය දා ඉදිරිපත් වෙච්ච උසස් පෙළ විභාගයේ තාක්ෂණවේදය විෂයයෙන් මුළු දිවයිනේම ප්‍රථම ස්ථානයට පැමිණිලා තියනවා. මම පෞද්ගලික ප්‍රකාශයක් හැටියට ඔබතුමාගෙන් අවස්ථාව ඉල්ලුවේ පෞද්ගලිකව මගේ පවුලේ සියළුදෙනාටත් දේශපාලන වශයෙනුත් අපට ඉතාම සම්බන්ධ පවුලක දරුවෙක් නිසා මම හිතුවා මම මේ අවස්ථාව ඉල්ලාගෙන සුභ පතන්න ඕන කියලා. මේ දියණිය ඉස්සෙල්ලාම ඉස්කෝලෙට ගියේ ගලිගමුවේ හත්නාගොඩ කණිෂ්ඨ විද්‍යාලයට. එයින් ශිෂ්‍යත්වය සමත් වෙලා කෑගල්ල රංවල මහානාග විද්‍යාලයෙන් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී ඉදලා, සාමාන්‍ය පෙළ විභාගයේ දී ඒ සාමාර්ථ 8 ක් අරගෙන එවකට තාක්ෂණවේදය තිබුනේ කෑගල්ලේ ස්වර්ණ ජයන්ති මහා විද්‍යාලය. පළාත් සභාවේ පාසලක්. ඒ පාසලට ගිහිල්ලා මේ දියණිය අද අපි සියළුම දෙනාට කෑගලු දිස්ත්‍රික්කයේ ගලිගමුවේ අපටත්, කෑගලු දිස්ත්‍රික්කයේ අපි සියළුමදෙනාටත්, සබරගමුව පළාතේ අපටත් ගෞරවයක් ගෙනල්ලා දීලා තියනවා. දිවයිනේම ප්‍රථම ස්ථානයට පැමිණිලා. ඉතින් මම හිතනවා අපේ සබරගමුව පළාත් සභාවේ අපි සියළුම දෙනාගේ සුභ පැතුම් මේ දියණියට එක් කරන්න ඕන කියලා, ඇගේ ජීවිතය සාර්ථක කරගන්න. මේ දියණියගේ පියා පෞද්ගලික ආයතනයක රියදුරු කෙනෙක් වශයෙන් සේවය කරන්නේ. මව ගෘහණියක්. තව මල්ලිලා දෙන්නෙක් ඉන්නවා. රංවල මහානාගයේ ඉගන ගන්නේ. ඉතින් මේ කට්ටියට සබරගමුව පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හරි, ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුග්‍රහයෙන් අපි උදව් කරන්න ඕන කියලා මම යෝජනා කරනවා, අපි සියළුදෙනාගේ සුභ පැතුම් ඒ දියණියට එක් කරන ගමන්. බොහොම ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* Hon.Chairman

*Kanchana Jayarathna* ----------------
-------------------------------------------

ස්තුතියි ! ගරු හර්ෂ සියඹලාපිටිය මැතිතුමාට.

***ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය*** ***கௌரவ***
***அமைச்சர் பானு முனிப்பிரிய*** *Hon. Minister*
*Bhanu Munipriya* ---------------
**---------------------------------------------**

ගරු සභාපතිතුමනි, අපේ සියඹලාපිටිය ගරු මැතිතුමා කියපු ආකාරයෙන් අ.පො.ස.(උ.පෙළ) ලංකාවේ ප්‍රථම ස්ථානය දිනාගත්ත දෙවෙනි අවස්ථාව මේක. පසුගිය අවස්ථාවේ ඇහැලියගොඩ ඔබතුමන්ලාගේ ප්‍රදේශයේ දියණියක් ලංකාවේම විද්‍යා අංශයේ පළවෙනියා වුනා. එතකොට දැන් මේ දියණියත් ඒ හා සමානවම ඉතාමත්ම හොඳ ප්‍රතිඵල පෙන්වලා තිබෙනවා. අපි අමාත්‍යාංශය වශයෙන් පසුගිය අවස්ථාවල මුදල් ප්‍රතිපාදන විශේෂයෙන්ම ශිෂ්‍යත්වයක් හැටියට ලබාදුන්නා. අද දිනයේ ඒ දියණියට අමාත්‍යාංශයට පැමිණීම සඳහා කථා කරලා ඒ කටයුතු කරන බවත්, මේ සම්බන්ධයෙන් ලංකාවෙන්ම අ.පො.ස. (උ.පෙළ) කොතනද ඉන්නේ කියන කාරණාවත් සමඟම මම ලබන වාරයේ දී වාර්තාවක් ඉදිරිපත් කරන බවත් මතක් කරමින් ඇයට සුභ පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*** *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
-------------------------------------------

ස්තුතියි ! ගරු අමාත්‍යතුමනි. ගරු අමාත්‍යතුමා ඒ වගේම හර්ෂ සියඹලාපිටිය ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි ඒ ලංකාවෙන්ම ප්‍රථම ස්ථානයට පත් වෙච්ච කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ගලිගමුව ආසනයේ ඒ ආදරණීය දියණියට සබරගමුව පළාත් සභාවේ අපි තමුන්නාන්සේලා සියළුදෙනාගේම සුභ පැතුම්, සුභාශිංසන එකතු කරන්න මේක අපි අවස්ථාවක් කරගන්නවා. ඒ වගේම අපි ඉදිරියේ දී ඒ පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් එක්ක සාකච්ඡා කරලා අධ්‍යාපන ඇමතිතුමා කිව්වා වගේ එතුමිය වෙනුවෙන් ඒ අවශ්‍ය සහයෝගය ලබාදෙන්න කටයුතු කරන බව දැනුම් දෙනවා. ඒ සුභ පැතුම් පණිවිඩය සියළුදෙනාගේම එක පණිවිඩයක් හැටියට අදාළ දියණියට දන්වා යැවීමටත් අපි කටයුතු කරනවා.

මීළඟට ගරු ජී.එම්.කරුණාපාල ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල*** ***கௌரவ***
***உறுப்பினர் ஜீ.எம்.கருணாபால*** *Hon.Member*
*G.M.Karunapala* ------------
-----------------------------

ගරු සභාපතිතුමනි, ලැබුවා වූ නව වසර සියළුදෙනාට ගුටි කන්නෙ නැතුව ජීවත් වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. කිරි පැණියෙන් එහෙම තොරව. අත්දැකීම්වලින් කථා කරන්නේ. මේක පෞද්ගලික ප්‍රශ්නයක් නොවේ කියලා කියන්න පුළුවන්. නමුත් මට පෞද්ගලික. එකක් මේ දවස්වල මහත් ආන්දෝලනට පත්වෙලා තියන සීමා නිර්ණය. මම පහුගිය 10 වෙනිදා ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති විධායක සභාවේ දී ඇහුවා පළාත් පාලන මැතිවරණය තියෙන්නේ කොහොමද ? කවදාද තියන්නේ ? මීට හරියට අවුරුද්දකට ඉස්සෙල්ලා කිව්වා සීමා නිර්ණය ඉවර වුන විගසම මේක පවත්වනවා

කියලා. අද වෙනතෙක් නෑ. පෙරෙයිදා ලැබුණ ආරංචි මාර්ගය තියන්නේ කොහොමද? නොතියනවාද? කියලා. මේක පෞද්ගලික ප්‍රශ්නය කොහොමද බලපාන්නේ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

මෙතුමන්ලා අහනවා පෞද්ගලිකව බලපාන්නේ කොහොමද කියලා.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* *கௌரவ*
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member*
*G.M.Karunapala* ------------
------------------------------

පෞද්ගලිකව බලපාන්නේ අපේ පාර හදන්නේ නෑ පළාත් පාලන ආයතනයෙන්. වතුර ටික බෙදන්නේ නෑ. අද උදේ ප්‍රශ්නයක්, රුපියල් පන්දහස් ගාණක් දෙන්න ඕන වතුර බවුසරයකට. පෞද්ගලික ප්‍රශ්නයක්.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார* *Hon.Member*
*Ajith Kumara* --------------
--------------------------------------------

මහ ඇමතිතුමාට කියන්න ඒක. පළාත් පාලන ඇමතිතුමා මහ ඇමතිතුමා.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* *கௌரவ*
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member*
*G.M.Karunapala* ------------
------------------------------

අර බලන්ගොඩ නගරයේම කුණු. පළාත් පාලන ආයතනය තිබුණා නම් ඕක වෙන්නේ නෑ. ඒ නිසා මේක මට පෞද්ගලිකයි. ඒ නිසා මේ ආණ්ඩුව මැතිවරණවලට තියන බය නිසා මේ මැතිවරණය කොහොමත් තියන්නෙ නෑ. ඒක පෞද්ගලිකව මට හා අපේ ජනතාව බලපානවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

කරුණාපාල මන්ත්‍රීතුමා ඔබතුමා පෞද්ගලික ප්‍රකාශයක් තියනවා නම් ඒක කරන්න. එහෙම නැත්නම් ඔබතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා ඒක කරන්න.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* *கௌரவ*
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member*

*G.M.Karunapala* ------------ -----------------------------

ඒ නිසා පෞද්ගලිකව බලවත් විරෝධය සබරගමුව පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට සීමා නිර්ණය කියන බොරුව නිතරම පෙන්වා පළාත් පාලන මැතිවරණය නොපැවැත්වීම. දෙක, අපි මේ ඊයේ පෙරෙයිදා ගියා හම්බන්තොටට. පෞද්ගලික ප්‍රශ්නයක්. මගේ වියදමින් ගියේ. හම්බන්තොටට ගියේ මේ රටේ මේ අහිංසක

මිනිස්සුන්ගේ ඉඩකඩම් ආරක්ෂා කර දීමට සහයක් දැක්වීමට. වතුර ගෙනල්ලා වතුර බවුසර් ගහලා, කඳුළු ගෑස් ගහලා, අනවශ්‍ය ලෙස හිරිහැර කරලා මේ රටේ මේ පොදු සම්පත් පෞද්ගලික අංශයට දීමට කටයුතු කළේ.........

**(සභාවෙන් සෝෂා)**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

කවුද ඒ සභාවේ ඉතාම අවලස්සන විදිහට.......

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ*
*அமைச்சர் அதுல குமார ராஹூபத்த* *Hon. Minister*
*Athula Kumara Rahubadda*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ ඉතිහාසයේ මේ පළාත් සභාව තුළ සත්තු වගේ හැසිරිලා නෑ. පක්ෂ වෙන්න පුළුවන් විපක්ෂ වෙන්න පුළුවන්, අපි විවාද කරගන්නවා. ආවේගශීලී වෙනවා. ඒ ඇරුනාම මේ පළාත් සභාව මේ ඉතිහාසය පුරාවටම ආදර්ශයක් දීපු පළාත් සභාවක් විදිහට මේ සංස්කෘතිය මම විශ්වාස කරනවා අදින් පස්සේ මේක මෙතනින් නවත්වන එක සුදුසුයි කියලා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

කරුණාපාල මන්ත්‍රීතුමා පොඩ්ඩක් නවත්වන්න.

**(සභාවෙන් සෝෂා)**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

දැන් මේ මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා මම දන්නෙ නෑ, මට කණට ඇහුණ එක විතරයි කියන්නේ. අර අතුල කුමාර රාහුබද්ධ මැතිතුමා කිව්වා වගේ කවුරු හරි මම හිතන්නේ ඉස්කෝලෙවත් යන්නෙ නැති, එහෙම නැත්නම් වෙන මොකක් හරි මොන්ටිසෝරිවලට ගිහිල්ලා මෙතනට ආපු කවුරු හරිත් මෙතන ඉන්න බව අපට පේනවා. ඉතින් මම විශ්වාස කරන්නේ නෑ මේ උගත්

මේ සබරගමුව පළාතේ ජනතාවගේ විසි ලක්ෂයක් වෙච්ච ජනතාවගේ ඡන්දය අරගෙන මෙතනට ඇවිල්ලා මේ උත්තරීතර සභාව නියෝජනය කරන අපේ ගරු මන්ත්‍රීතුමන්ලා එහෙම හැසිරෙයි කියලා මම විශ්වාස කරන්නෙ නෑ. ඒ නිසා ගරු අපේ ඇමතිතුමා ප්‍රකාශ කළා වගේම මීන් ඉදිරියට එවැනි කටයුතු නොවෙන්නට සියළුදෙනාම වගබලා ගන්න කියලා ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ වගේම මොන හේතුවක් නිසාවත් මීන් පස්සේ න්‍යාය පත්‍රයේ තියන කාරණාවලට ඇරෙන්නට වෙන කිසිදු මන්ත්‍රීවරයෙක් මගෙන් වෙලාව ඉල්ලන්න එන්න එපා. න්‍යාය පත්‍රයට රීති අනුව කටයුතු කරනවා මම මෙතනින් එහාට.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* *கௌரவ*
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member*
*G.M.Karunapala*
------------
-----------------------------

ඒකට අපි විරුද්ධයි. අපට මේ න්‍යාය පත්‍රයට පෞද්ගලික අදහස් දක්වන්න අවස්ථාවක් අවශ්‍යයි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna*
---------------
-------------------------------------------

ඔබතුමා වාඩි වෙන්න. පෞද්ගලික ප්‍රකාශ කරන්න ඉඩදෙන්න පුළුවන්. න්‍යාය පත්‍රයේ නැති දේවල් කථා කරන්න ඉඩදෙන්න බෑ එහෙම. තමුන්නාන්සේලා හැමෝටම රීති පොත් දීලා තියනවා. නැති කෙනෙක් ඉන්නවා නම් රීති පොත මගෙන් ඉල්ලන්න. මම දෙන්නම්. මීන් පස්සේ රීති පොතේ තියන ආකාරයට වෙලාවල් ඉල්ලන්න. න්‍යාය පත්‍රයට ඇතුල් කරන්න. රීති පොතේ තියන ආකාරයට කටයුතු කරන්න. එච්චරයි තියෙන්නේ. මගේ පෞද්ගලික කාරණාවක් නෙමෙයිනේ මේක. මේක සෙල්ලම් මඩුවක් වෙන්න දෙන්න බෑ. පෞද්ගලික දේවල් ප්‍රකාශ කරන ක්‍රමයක් තියනවා මේකේ. ඉතින් ඒ ක්‍රමය හරහා කරන්න. මේක මෙච්චර කාලයක් ආපු විදිහක් තියනවානේ. ප්‍රශ්නයක් තියනවා නම් යෝජනාවක් ඉදිරිපත් කරන්න. යෝජනාවක් ගෙනල්ලා කථා කරන්න. නැතුව මේ මෙතන මාව හැල්ලුවට පත් කරන්න එපා. ඒ වගේම දැඩි ලෙස මගේ අප්‍රසාදය පළ කරනවා කවුරු හරි අර කරපු ඉතාම අසීලාචාර, අසික්කිත වැඩේ ගැන.

හූ කියන එක මේ සභාවට ගැලපෙන කාරණාවක් නෙමෙයි. දැඩි ලෙස හෙළා දකිනවා ඒ කාරණාව පිළිබඳව.

මීළඟට සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා ඔබතුමාගේ අවස්ථාව.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම 2017 වසරට සුභ පතන්න මේක අවස්ථාවක් කරගන්නවා. ගරු සභාපතිතුමා, ප්‍රධාන ඇමතිතුමා, කැබිනට් එකේ ඇමතිතුමන්ලා, අපේ විපක්ෂනායකතුමා, පක්ෂ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමිය, අපේ නව ලේකම්තුමිය, සහකාර ලේකම්තුමිය ඇතුළු මේ සබරගමුව පළාත් සභාවේ වැඩ කරන සියළුම නිළධාරී මහත්ම මහත්මීන් ඇතුළු ගැලරියේ සිටින සියළුම මාධ්‍යවේදී

මහත්වරුන්ටත් ලැබුවා වූ 2017 වසර උඩින් පායන අව්වත්, වටින් හමනා සුළඟත් ඇර අතුරු ආන්තර, සතුරු කරදර කිසිවක් නැතුව ගරු සභාපතිතුමනි, ලැබුවා වූ 2017 වසර සැපෙන් බර, දුකින් තොර, වාසනාවන්තම වසරක් සබරගමුව පළාතේම විසි ලක්ෂයක් ජනතාවට ආශිර්වාදයක් ලෙස පතමින් ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය තියෙන්නේ ගරු සභාපතිතුමනි, නිවාස ආධාර දීම සම්බන්ධවයි. ඔබතුමා මට අවස්ථාව දෙනවා නම් මෙතන ලොකු අසාධාරණයක් සිද්ධ වෙලා තියනවා, සබරගමුව පළාතේ ජනතාවට ගරු සභාපතිතුමනි. ඒකට මට අවස්ථාව ඔබතුමා දෙනවාද ?

වගකීමෙන් කියනවා 30,000 හය දෙනෙකුට දෙන්නේ නැතුව 30,000 එක්කෙනෙකුට දෙන්න. එතකොට ඒ අයගේ ප්‍රශ්නය ඉවරයි. මොකද අවුරුදු 5 ක්, 6 ක්, 7 ක් යනකල් අර අසරණ මනුස්සයාට කිසිම දෙයක් ගන්න බැරි වෙනවා. බොන මනුස්සයෙක් නම් දවස් 10 යි ගරු සභාපතිතුමනි, බොන්නේ රුපියල් 5000 න්. එතකොට ඒ මනුස්සයාගේ ප්‍රශ්නය විසඳෙන්නේ නෑ. මේක ගරු සභාපතිතුමාගෙන් මම ඉල්ලනවා සභාවේම යෝජනාවක්, නීතියක් දාලා රු.30,000 ක් වෙන් කරනවා නම් අහිංසක වැසියෙකුට ඒ 30,000 ම භාණ්ඩ ලබාදීමට කටයුතු කරන්න ඕන කියන එක ගරු සභාපතිතුමනි, මම කියනවා.

ගරු ප්‍රධාන ඇමතිතුමනි, නිවාස ආධාර කියලා අපේ ගරු මන්ත්‍රීතුමන්ලා දෙනවා කෙනෙකුට 30,000 යි. 35,000 යි. 40,000 යි. මේ විදිහට. මේක ගරු සභාපතිතුමනි, නිවාස ආධාර කිව්වාම අසරණ මනුස්සයෙකුට, එයා කුලී වැඩ කරන මනුස්සයෙක්. ගෙයක් නැති මනුස්සයෙක්. වහළය පෙනේරේ වගේ හිල් වෙච්ච ගෙයක් තියෙන්නේ. ඒ වගේම පොල් අතු දැම්මා නම් පොල් ඉරට විතරයි තියෙන්නේ. ඉලුක්, මානා දාපු වහළ. මේ අයට නිවාස ආධාර දෙනවා කියලා 30,000 ක් දුන්නට පස්සේ ඒ 30,000 හය දෙනෙකුට දෙනවා නම් එතන ලොකු අසාධාරණයක් ගරු සභාපතිතුමනි. මොකද ඒ අහිංසක කම්කරුවන්ට රු.30,000 ගානේ හය දෙනෙකුට දෙනවා නම් ඒ පුද්ගලයාට ෂීට් දෙක හමාරයි ගන්න පුළුවන්. 30,000 ක් දෙනවා නම් ෂීට් 16 ක් ගන්න පුළුවන් ගරු සභාපතිතුමනි. මේක 30,000 හය දෙනෙකුට දෙනකොට හය දෙනාගේම ප්‍රශ්නය විසඳෙන්නේ නෑ. සමහර මන්ත්‍රීවරු හිතනවා ඇති ඡන්ද ප්‍රමාණය වැඩි කරගන්න. ඒ ඡන්ද ප්‍රමාණය කොහොම වැඩි කරගත්තත් කමක් නෑ. සබරගමුව පළාත් සභාවෙන් දෙන ආධාර මුදල ගරු සභාපතිතුමනි, මම

මම ඊයේ පෙරෙයිදා දැක්ක දෙයක්. අපි පළාත් සභාවෙන් ලක්ෂ 4, 5, 10 කොන්ත්‍රාත් දෙනවා. ඒ වගේම විමධ්‍යගත ඒවායෙනුත් දෙනවා. මේ එන ඒවායෙන් ගරු සභාපතිතුමනි, වැලි කියලා මඩ ගෙනල්ලා දානවා. මඩ ගෙනල්ලා දාන අය ඒ ඒ මන්ත්‍රීවරු දැනුවත් කරනවා මන්ත්‍රීතුමා, මේක කරන්න දෙන්න එපා. මේ බැම්ම හරියට සකස් වෙන්නේ නෑ. මේක පවතින්නේ නෑ. මේක කරන්න එපා කියලා. නමුත් ඒ මන්ත්‍රීවරුත් ඒ ගැන වගකීමක් අවධානයක් යොමු කරන්නේ නෑ ගරු සභාපතිතුමනි. මේ කොහෙන් සල්ලි දුන්නත්, පළාත් පාලන උපමාන පාදක අරමුදල් වෙන්න පුළුවන්. ප්‍රාදේශීය සභාවේ විමධ්‍යගත අයවැයෙන් වෙන්න පුළුවන්. මේ කොහෙන් දුන්නත් රජයේ සල්ලි. මේ සල්ලිවලට අහුපැවතක් ඇතුව වැඩ කෙරෙන්න ඕන ගරු සභාපතිතුමනි. අන්න ඒ නිසා ගරු සභාපතිතුමනි, නියෝගයක් කරන්න මේ වැඩ කරනකොට මන්ත්‍රීවරුන්ගෙත් විශේෂ අවධානය යොමු වෙන්න කියන්න. ඒ මන්ත්‍රීවරු දැනුවත් කළොත් අනේ මන්ත්‍රීතුමා මේක දාන්න එපා. මේ බැම්ම පවතින්නේ

නෑ. එතුමා ඒ කොන්ත්‍රාත්කරුවාට ඕන විදිහට කරනවා නම් මේ සභාව හෑල්ලුවට ලක් වෙනවා ගරු සභාපතිතුමනි. මේ ගැන අවධානය යොමු කරන්න කියලා කියමින් මම නිහඬ වෙනවා ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna* ----------------------------------------------------------------

ස්තූතියි ! සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද කාරණා දෙක පිළිබඳව අපි ඉදිරියේ දී කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

**ශෝක ප්‍රකාශ යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා : නැත**

**පළාත් සභාවේ පොදු කටයුතු : නැත**

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna* ----------------------------------------------------------------

ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබාදෙනවා.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය* *கௌரவ*
*நமிந்த அனுரபிரிய* *Hon.Member Naminda Anurapriya* ----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, සුභ නව වසරක් වේවා ! ගරු මන්ත්‍රීතුන්ලා, අමාත්‍යතුමන්ලා, සභාපතිතුමා ඇතුළු අපේ අළුත් ලේකම්තුමිය ඇතුළු හැමදෙනාටම.

ගරු සභාපතිතුමනි, විදුලිබල අර්බුදයට මුවාවී සමනල කන්ද අඩවියේ ජල මූලාශ්‍ර විනාශ මුඛයට ඇද වැටීමේ තර්ජනයෙන් බේරා ගැනීමට අතිගරු ජනාධිපතිතුමාට සම්මත කර යැවීමට යෝජනාවක් හැටියට තමයි ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කරලා තියෙන්නේ.

ගරු සභාපතිතුමනි, අපේ උතුම් සම්මා සම්බුදු රජාණන්වහන්සේගේ පාද පද්මය පිහිටලා තියන සමනල කන්ද අඩවියේ ඉදලා ගලා බසින ජල ධාරාවන්ගෙන් විශාල ප්‍රමාණයකට මේ වෙනකොට ඉහළ ප්‍රදේශවල විදුලි බලාගාර ඇති කරලා තිබෙනවා. එහි ප්‍රධාන ස්ථානයක් තමයි ගරු සභාපතිතුමනි, සීත ගඟුල. සීත ගඟුලෙන් අපි නාලා තමයි ශ්‍රීපාද පද්මය වන්දනා කරන්න අපි යන්නේ. මේ සීත ගඟුල හරහා ගලා බසින වර්ණගල රක්ෂිතය හරහා පහළ කුරුවිටින්, එරත්නෙන් අපේ කිරිඇල්ල බලප්‍රදේශයේ කුරුගම්මෝදර දක්වා එන කුරුගඟ හරස් කරලා ගරු

සභාපතිතුමනි, මේ වෙනකොට විදුලි බලාගාර තුනක් ඉදිකරලා තිබෙනවා. ඒ වගේම මරු කන්ද විදුලි බලාගාරය යනු කුමක්ද ? කොහේද ? කොතනද ? මොකක්ද ? කියන කාරණාව මම පළමුව පැහැදිලි කළයුතුයි ගරු සභාපතිතුමනි. ඒ පැත්තෙන් ශ්‍රීපාද පද්මය හරහා ගලාගෙන සීතගඟුල. අනෙක් පැත්තෙන් තිබෙන්නේ ප්‍රධානම ස්ථානය දිවාගුහාව. ඒක බුදුරජාණන්වහන්සේ දිවා විහරණය කළ ස්ථානය. ඒ ස්ථානය අසළින්ම තමයි මේ සීතගඟුල ගලාබසින්නේ. මම විශ්වාස කරනවා සමහර වෙලාවට බුදුරජාණන්වහන්සේ දිවා විහරණය කරන අවස්ථාවේ දී මේ ස්ථානයෙන් ස්නානය කරන්න ඇති. එහෙම නැත්නම් උන්වහන්සේ දිය වළඳන්නත් ඇති මේ ස්ථානයෙන්. ඒ වගේ ස්ථානයක්. උතුම් තැනක්. පරිසරයට හොඳ තැනක්. ඒ වගේම මේ ගලා බසින ජල ධාරාව ඉතාමත්ම රමණීයයි.

මේ තුළ තිබෙනවා ගරු සභාපතිතුමනි, අලංකාර ස්ථාන ගණනාවක්. ඉතින් ඒ නිසා මගේ යෝජනාව ගරු සභාපතිතුමනි, මේ මරුකන්ද විදුලි බලාගාරය ඉදිකිරීම නිසා කුරුගඟේ බලාගාර තුනක් දැනට ඉදිකරලා තිබෙනවා. මේ ඉදිවෙන්නේ හතර වෙනි බලාගාරය. ඒ වගේම ගඟේ සුන්දරම කොටස්වල ජලය සිඳී යැම. නෑමට, බීමට වතුර අහිමි වෙන නිසා අපි ආදරය කරන ප්‍රධානම තැනක් තමයි ගරු සභාපතිතුමනි, පුංචි දුන්හිඳ ඇල්ල. පුංචි දුන්හිඳ ඇල්ල තිබෙන්නේ මේ ස්ථානයේ. ඒ වගේම වැල්ලව තොටුපල. ඒ වගේම ගරු සභාපතිතුමනි, නාන ස්ථාන, තොටුපළවල් 23 ක් මේ මරුකන්ද විදුලි බලාගාරය ඉදිකිරීම නිසා අපට අහිමි වෙනවා. ඒ වගේම ජල පෝෂක ප්‍රදේශ තුළින් විශේෂයෙන්ම තේ වගාව ඇතුළත්ව වගා කරන ප්‍රදේශයේ ජල ධාරාවන් නොමැති නිසා මේවා වියළි බවට පත්වෙලා තිබෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ ස්ථානය පිහිටලා තිබෙන්නේ ගල් තට්ටුවලින්. ගල් තට්ටු ස්ථර හැටියට පිහිටලා ඒවා ඇතුළේ ඉතාමත්ම මනරම් වූ තුරුළතා වෘක්ෂ මඩුල්ලක් වගේ තමයි මේ දිහ දහරාවන් තිබෙන්නේ. ඉතින් ඒ නිසා මේක වේලිලා ගියොත් එහෙම මහා වර්ෂාවල් හැදීගෙන එනකොට මේ ගල් තට්ටු පිටින් තිබෙන ඒවා සෝදා ගලාගෙන ඇවිල්ලා මේ ප්‍රදේශය නාය යන්නට අනිවාර්යයෙන්ම සිදුවෙන බවට පරිසර සංවිධානවලින් කියලා තියනවා.

ඒ වගේම බටතොට දිවා ගුහාව බැතිමතුන්ගේ සහ සංචාරකයින්ගේ විශාල ඇල්මක් බැල්මක් දක්වන ස්ථානයක්. එතන තියනවා ලස්සන නාන්න හොඳ තැනක්. ඒ වගේම දිවා ගුහාවට එන ජනතාව මෙතනින් එගොඩ වෙනකොට ඉතාමත්ම ඔවුන්ට අළුත් සිසිලසක් ලැබෙනවා. ඒ ස්ථාන පහුකරගෙන

විදුලි බලාගාර ඉදිවෙන්න අවශ්‍ය කටයුතු කරගෙන යනවා ගරු සභාපතිතුමනි.

විශේෂයෙන් මතක් කළයුතුයි ගරු සභාපතිතුමනි, ජල විදුලි උත්පාදනය කිරීමට, ඒ වගේම මේ දිය ඇලි, එහෙම නැත්නම් දිය දහරා පාවිච්චි කර ගැනීමට මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ රටේ සමස්ත විදුලි උත්පාදනය, මේකේ මම හිතන්නේ මෙගා වොට් 1.5 ක් වගේ ගාණක් තමයි උත්පාදනය කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඉතින් මේකේ සමස්ත විදුලිය ජනනය කරන ප්‍රමාණය සහ සමස්ත විදුලි පද්ධතියට මහා ලොකු සේවාවක් වෙයි කියලා මම හිතන්නේ නෑ. නමුත් ඊට එහා සුළං බලයෙන්, ඒ වගේම දැන් තිබෙන හිරු එළිය භාවිතයෙන් නොයෙකු ආකාරයේ විදුලි උත්පාදනය කිරීමට හැකියාව තිබියදී, මමත් ගරු සභාපතිතුමනි, එක්තරා අවස්ථාවක දී මට

මතකයි මම මේ කුරුගඟ මිනි හයිඩ්‍රෝ පවර් ආයතනය ආරම්භ කරන වෙලාවේ දී ඒ මහත්වරු මගෙන් ඇහුවාම මම කිව්වා කමක් නෑ, මූලික පරිසර වාර්තාවක් ඒ ස්ථානයේ පරීක්ෂණයක් කරලා, ඒ වගේම සියළුම ආයතනවල අනුමැතිය දීලා තියනවා නම් කමක් නෑ ඉදිකළාට. හැබැයි මේකට ගරු සභාපතිතුමනි, මමත් කිව්වා කමක් නෑ කියලා. මම ඒ ස්ථානයට ගිහිල්ලා තිබුනේ නෑ ගරු සභාපතිතුමනි, ඒ වෙනකොට. මමත් සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාත් මෑතක දී මේ ස්ථානයට ගියා ගරු සභාපතිතුමනි. පුංචි දුන්හිඳ කියන දිය ඇල්ල ඉතාමත්ම රමනීය, අපේ ලංකාවේ අය දන්නේ නැති වුනාට විදේශිකයන්ගෙන් ඇහුවොත් විදේශිකයන් දන්නවා. විදේශිකයෝ ගණනාවක් ඇවිල්ලා නාන ස්ථානයක්. ඉතාමත්ම රමනීය තැනක්. මේ ස්ථානයේ ගරු සභාපතිතුමනි, ඉන්නවා මේ කඳුකර ආශ්‍රිතව ජීවත් වෙන මාළු වර්ග 41 ක්. දැනට පරිසරවේදීන් හොයාගෙන තියනවා. ඒ වගේම හොරපොළයා කියන මාළුවා හරි ලස්සනයි. බඹයකට වඩා දිගයි. ඒ මාළු ඉතාමත්ම ලස්සනට සැරිසරණ ස්ථාන කීපයක් විතරයි තියෙන්නේ. ඒ වගේම මේ රටට ආවේනික වෙව්ව, ශ්‍රීපාද අඩවියට ආවේනික වෙව්ව කක්කුට්ටෝ, ඒ වගේම කුඩා ජලජ ජීවීන්, ඒ වගේම අපට ඇසට නොගැටෙන, ඒ වගේම පහළ ප්‍රදේශයන්වලට අවශ්‍ය ඒ ජෛව විවිධත්ව තුළින් අපට ලැබෙන ජීවීන් සමූහයක් මේ තුළ ඉන්නවා ගරු සභාපතිතුමනි.

ඒ නිසා සමස්ථ විදුලි අර්බුදයට අපි විසඳුමක් සෙවිය යුතුයි. නමුත් මේ ස්ථානයට මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි, යා යුතුයි අපි හැමදෙනාම. ගරු ප්‍රධාන ඇමතිතුමා අපේ විදුලිබල ඇමතිතුමා හැටියට මම ඉල්ලා සිටිනවා ඔබතුමා මේ ස්ථානයට එන්න බලන්න. බැලුවාට පස්සේ තේරෙයි මොකක්ද මේ වෙන හානිය කියලා. ගරු සභාපතිතුමනි, මමත් සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාත් මේ ස්ථානයේ ජනතාවගේ විරෝධතාවයක් ඇති වෙන ස්ථානයකට ගියා. ඒ අවස්ථාවේ අපි දෙන්නාම ගියා මේ ස්ථානය පරීක්ෂා කරන්න. මහා වනාන්තරයේ රුස්ස ගස් අස්සේ කොන්ක්‍රීට් කෑලි ගහගෙන. සාමාන්‍ය මනුස්සයෙකුට අඩුම තරමේ දර කෑල්ලක් රක්ෂිතයකින් ගෙනියන්න ආවොත් නීතිය ක්‍රියාත්මක වෙනවා. නමුත් මෙතන වෙන්නේ මහා විශාල හානියක්. බලන්න ගිහිල්ලා. ඉතින් ඒ නිසා මම බලපු නිසා තමයි මට මේ ගැන ඉතාමත්ම හොඳින් වැටහුනේ ගරු සභාපතිතුමනි. ඒ නිසා මම පැහැදිලි කිරීමට ගන්නේ ගරු සභාපතිතුමනි, කුරුගඟ හයිඩ්‍රෝ පවර් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයෙන් මරුකන්ද ව්‍යාපෘතිය 1.8 ක ඉදිකිරීම් සම්බන්ධයෙන් පාරිසරික ඇගයීම් අධ්‍යක්ෂිකා කාන්ති ද සිල්වා මහත්මියට මධ්‍යම පරිසර අධිකාරියෙන් එතුමියට යවලා තියනවා කුරුගඟ හයිඩ්‍රෝ පවර් එකෙන් ලිපියක් මරුකන්ද ව්‍යාපෘතිය. උක්ත ව්‍යාපෘතියට අවශ්‍ය සියළුම රාජ්‍ය ආයතනවලින් රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව. රාජ්‍ය බුද්ධි සේවාව හා අරලිය ගහ මන්දිරයේ මෙහෙයුම් මැදිරියේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය ද ලැබී ඇත. එම ව්‍යාපෘතියට අදාළ ඉඩම් නිදහස් නොකිරීම හේතුවෙන් කොළඹ අභියාචනාධිකරණයේ 346/18 යටතේ නඩු පැවරීමෙන් අනතුරුව එකී ව්‍යාපෘතියට අවශ්‍ය සියළුම ඉඩම් 2016.11.10 වෙනි දින රජය විසින් සමාගමට නිදහස් කර ඇත. ඉහත කරුණු හේතුකොටගෙන 2016.11.25 දින එම ව්‍යාපෘතිය ඉදිකිරීම් කටයුතු කරන ලෙස සතුටින් දැනුම් දෙමි කියලා, මේ ලිපිය යවන්නේ කුරුගඟ හයිඩ්‍රෝ පවර් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ පාරිසරික ඇගයීම් අධ්‍යක්ෂිකාව වෙත ගරු සභාපතිතුමනි, මේ ලිපිය යවන්නේ. එතකොට ගරු සභාපතිතුමනි, අපට තිබෙන ගැටළුව මේකයි. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ තීරණ ගනු ලබන්නේ එකම සභාපතිවරයෙකුගේ

අභිමතය පරිදි නොව කමිටුවට පැමිණෙන මහජන නියෝජිත මහත්වරුන්ගේ, පළාත් පාලන ආයතනවල නිළධාරීන් හා රාජ්‍ය නිළධාරින්ගේ ද අදහස් විමසා එකඟතාවය ගැනීමෙන් පසුවය. එක් සම සභාපතිවරයෙකු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන බවට වාචික පෙත්සම් කාරක සභාවට එම සමාගම එකඟතාවය පළ කළේයැයි කියන කාරණාව පිළිගත නොහැක. මේ කියන්නේ දිස්ත්‍රික් ලේකම්තුමා ගරු සභාපතිතුමනි. ඉහත සඳහන් කුරුගඟ විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා තහනම් කරමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ගෙන තිබූ තීරණය වෙනස් කර දෙන ලෙසටය. එම ලිපිය 2016.12.20 දිනැති පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර ඇති අතර, අවට ප්‍රදේශයේ ජන ජීවිතවලට හානි නොවීම ජල භාවිතා කරන මහජනතාවගේ පාරිසරික අවශ්‍යතාවයන්වලට හානි නොවන ලෙස යන කොන්දේසි මත කුඩා විදුලි බලාගාරයට අවසර දෙන ලදී. මෙය කුඩා ජල විදුලි බලාගාරයට අවසර දීමක් නොවන අතර, පොදුවේ යම් කොන්දේසිවලට යටත්ව ගත් ප්‍රතිපත්තිමය තීරණයකි.

ලේකම්තුමාගේ වාර්තාව මම ඔබතුමාට ඉදිරිපත් කළේ. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, රජයේ නියෝග 204 ප්‍රකාරව අයදුම්පතක් ඉදිරිපත් කළයුතු අන්දමින් අයදුම්පතක් ඉදිරිපත් කළ ද ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කළයුතු ඉඩම් නියෝග ප්‍රකාරව කළයුතු පරීක්ෂා කිරීම්වලින් පසුව ඉඩම් කොමසාරිස් විසින් නිර්දේශය වාර්තාවට යවනු ලැබේ. ඉඩම් කොමසාරිස්වරයාගේ වාර්තාව සහිතව ඉඩම් අමාත්‍යවරයාගේ ද අනුමැතිය ඇතිව මෙබදු ඉඩම් බදුදීම කරනු ලැබේ. ගරු සභාපතිතුමනි, මේක ප්‍රාදේශීය ලේකම්තුමා මේ කරලා තිබෙන්නේ වැරදි ක්‍රියාවක්. එතුමා මේ ස්ථානයට ගිහිල්ලා නෑ ගරු සභාපතිතුමනි. දැන් ඉන්න ප්‍රාදේශීය ලේකම්තුමා ඒ ස්ථානයට බලන්නේ නැතුවයි ගරු සභාපතිතුමනි, අනුමැතිය දීලා තිබෙන්නේ. මේක වැරැද්දක්. ඒ වගේම පරිසර අමාත්‍යාංශයේ පරිසර වාර්තාවක් ඒ කියන්නේ අපි දන්නවා සාමාන්‍යයෙන්

ගරු සභාපතිතුමනි, මේ ආකාරයෙන් රාජ්‍ය බුද්ධි සේවාව හා පෙත්සම් කාරක සමාගම වෙත වාර්තා සපයන ආයතනයක් නොවේ. රාජ්‍ය බුද්ධි සේවාව පෙත්සම් කාරක සභාව වෙත වාර්තා සපයන ආයතනයක් නොවෙයි. එළෙස ඉල්ලුම් කර රාජ්‍ය බුද්ධි සේවාව වාර්තා පුද්ගලික ආයතනවලට ලබා ගැනීමට නොහැකියි ගරු සභාපතිතුමනි. ඒ වගේම පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ අනුමැතිය ද පෙත්සම් කාරක සභාවට ලබාගත හැක්කක් නෙමෙයි. අමාත්‍යාංශයක් යටතේ සිදුකරන කටයුතු පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කරුණු විමසීම සඳහා ස්ථාපනය කර ඇති උපදේශක කාරක සභාව, පෙත්සම් කාරක සමාගමට කිසිදු කාර්යය භාරයක් නොමැති අතර, ඉල්ලීමක් ඉදිරිපත් කිරීමටවත් අදාළ සමාගමට ක්‍රියා කළහැකි බවක් නොපෙනේ. මේ ගරු සභාපතිතුමනි, දිස්ත්‍රික්

ඊ.අයි.ආර්. එකක්, සම්පූර්ණ එකක් අරගෙන නෑ මේ පිළිබඳව. ඒ සඳහා ඒ ස්ථානයට ගිහිල්ලා නෑ ගරු සභාපතිතුමනි. ඒ වගේම අදාළ රාජ්‍ය ආයතනවල නිළධාරීන් මේ ස්ථානය පරීක්ෂා කරලා මේක කරන්න සුදුසු එකක් ද, නැද්ද කියලා නෑ. මේ පිළිබඳව අවසරය දීලා තිබෙන්නේ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව සහ බුද්ධි සේවාව. රාජ්‍ය බුද්ධි සේවාව. ඒ වගේම අරලියගහ මන්දිරයේ මෙහෙයුම් මැදිරියේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ ආයතනවලට මෙහෙම බලය දීමේ හැකියාවක් නෑ. මේකට පරිසර ආයතන තමයි ගරු සභාපතිතුමනි, ඒ වගේම වාරිමාර්ග අමාත්‍යාංශය, පරිසර, ගොවිජන සේවා, ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, භූ විද්‍යා හා පතල් කැනීම් මේවා

තමයි ගරු සභාපතිතුමනි, මේ සඳහා ඊ්.අයි.ආර්. එකට අවසරය ලබාදෙන්නේ. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙතන ලොකු වැරැද්දක් වෙලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව දැන ගත්තේ අපි මේවාට ගිහාම. ඒ නිසා මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි, මේ මරුකන්ද විදුලි බලාගාරය ඉදිකිරීම වහාම නතර කිරීමට මේ සභාවට ඉදිරිපත් කරපු යෝජනාව අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කරලා මේක වහාම නතර කරන ලෙසත්, ඒ වගේම අපේ පළාත් සභාවේ ඉන්න විදුලිබල අමාත්‍යවරයා හැටියට මහීපාල හේරත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරලා පළාත් සභාවේ පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රීතුමන්ලාගේ අවධානය මේ පිළිබඳව යොමු වෙලා මේ උතුම් සම්බුද්ධ පාද ලාංඡනය, සොළොස්මස්ථානවල ස්ථාන දෙකක් පිහිටලා තිබෙන මේ ස්ථානය, රමණීය පරිසරය රැක ගැනීමට, ඒ වගේම අපි සියළුම රත්නපුරේ, කෑගල්ලේ ආදරණීය අගය කරන අය. ඒ නිසා අපේ අඩවිය තමයි ගරු සභාපතිතුමනි, සමන්දේව අඩවිය.

ඒ නිසා උන්වහන්සේගේ සමන්දේව අඩවිය අපි රකින්න මේ විසි එක් ලක්ෂයක් ජනතාවගේ නියෝජිතයෝ හැටියට තමයි අපි මෙතෙන්ට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි කළයුතු දේ තමයි උතුම් සම්මා සම්බුදුරජාණන්වහන්සේගේ ශ්‍රීපාද පද්මය රකින, ඒ වගේම සමන්දේව රාජෝත්තමයන් වහන්සේගේ මේ අඩවිය රකින්නට, පරිසරය රැකලා දෙන්නට මෙහි වගකීම්කරුවෝ හැටියට පළාතේ භාරකරුවෝ හැටියට පළාත් සභාව තමයි වගකියන්නේ සමන්දේව රාජෝත්තමයන් වහන්සේට. ඒ නිසා උන්වහන්සේගේ ආශිර්වාදය ඇතුව උන්වහන්සේගේ අඩවිය ආරක්ෂා කිරීමක් හැටියට අපි මේ බලාගාරය ඉදිකිරීම නතර කරන ලෙස ගරු සභාපතිතුමනි, උතුම් සම්මා සම්බුදුරජාණන් වහන්සේගෙනුත්, සමන්දේව රාජෝත්තමයන් වහන්සේගෙනුත් ඉල්ලා සිටිමින්, ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ වාර්තාව සම්මත කරලා ගරු ජනාධිපතිතුමා වෙතටත්. පරිසර අමාත්‍යතුමා වෙතටත්, ඒ වගේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමන්ලා සහ දිස්ත්‍රික් ලේකම්තුමාටත් මේ පිළිබඳව යවන ලෙස ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------

ස්තූතියි ! නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමාට. මීළඟට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මරුකන්ද විදුලි බලාගාරය ගැන කථා කරනවිට ගරු සභාපතිතුමනි, මම නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරමින් කථා කරනවා. මෙතන විශේෂත්වයක් තියනවා ගරු සභාපතිතුමනි. අපේ කුරුවිට ප්‍රාදේශීය ලේකම්තුමා මේ ගඟ දෙපැත්තේ ජනතාව ගත්තාම වසර 36 කට වැඩි කාලයක් මේකේ ජීවත් වෙනවා. බදු ගෙවනවා. එතකොට බදු ගෙවනවා නම් ගරු සභාපතිතුමනි, ඒක

දිස්ත්‍රික් ලේකම්තුමාගෙන්, එහෙමත් නැත්නම් තවත් කෙනෙකුගෙන් නීතිය ගැන අවබෝධයෙන් කටයුතු කරන්න ඕන කියන එකයි ගරු සභාපතිතුමනි, මොකද මේ සම්බන්ධයෙන් නීතිය ගැන අවබෝධයෙන් කටයුතු කරන්න ඕන කියන එකයි පළමුවෙන්ම මම මතක් කරන්නේ ගරු සභාපතිතුමනි. මොකද අහිංසක රටවැසියෙක් ඉඩමක් නැතිකමට රිසිවේෂන් එකේ ජීවත් වෙන ගමන් වසර 36 ක් බදු ගෙවලා තියනවා. වසර 36 ක් බදු ගෙවපු ඉඩමට කුරුවිට ප්‍රාදේශීය ලේකම්තුමා ලියුමක් දෙනවා විදුලි බලාගාරයක් තැනීම සඳහා මේ අවසර කියලා අවසර පත්‍රයක්. එතකොට මේක දිස්ත්‍රික් ලේකම්තුමාගෙන් එක්කෝ එහෙමත් නැත්නම් ඉහළින් වගකීම දරණ කෙනෙක්ගෙන් අනුමැතිය අරගෙන දෙනවා නම් ප්‍රශ්නයක් නෑ. මෙතන විශාල වරදක් කරලා තියනවා මේ වැඩේ ගරු සභාපතිතුමනි. මොකද අන්න ඒ ගැන තමයි විශේෂයෙන්ම අවධානය මම යොමු කරන්නේ, මේ වරද නිවැරදි කරන්න කියලා. මොකද අපි මේ පළාත් සභාවේ මරුකන්ද විදුලි බලාගාරය ගැන හය පාරක් කථා කළා. හය පාරම රංජිත් බණ්ඩාර මැතිතුමා, අතුල කුමාර රාහුබද්ධ මැතිතුමා, අපි වැඩි හරියක්, බහුතරයක් මේකට විරුද්ධව කථා කළා. නමුත් මේක

යටින් වරින් වර උඩට එන්නේ ඇයි ? දැන් තමුන්නාන්සේ ඒ කාලයේ හිටියේ නෑ. බෝපත් ඇල්ල විදුලි බලාගාරය නවත්වන්න කියලා පළාත් සභාවේ එදාත් හිටියා 44 ක් ගරු සභාපතිතුමනි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රැස්වීම තිබුනේ. මම මේක එවකට 94 ආණ්ඩුව, ජනාධිපතිවරිය කවුරු කිව්වත් මේකේ විදුලි බලාගාරය ගහනවා කියනවිට ඔබතුමා ඒවා දැකලා ඇති පුවත්පත්වල. කවුරු විදුලි බලාගාරය ගැහුවත් මේක නවත්වා ගන්න බැරි වුනොත් ඇල්ලෙන් පල්ලට පනිනවා කියලා අපි කථා කරලා අන්තිම මොහොත වෙනකොට විදුලි බලාගාරය ඉදිකරන්න කන්ටේනර්වල බඩු ආවා ගරු සභාපතිතුමනි. එදා පළාත් සභාවට ජනතාව දැනුවත් කරලා 4000 කට වැඩිය

ගෙන්නුවා. ගෙනල්ලා පළාත් සභාවේ 44 දෙනා එක්කම කථා කළා. මේ බෝපත් ඇල්ල විදුලි බලාගාරය නවත්වන්න නම් සුන්දර දිය ඇල්ල, මේ බාල පරම්පරාවට නාන්න, නරඹන්න, විනෝද වෙන්න කියලා. 44 න් එදා එක්කෙනෙක්වත් එළියට බැස්සේ නෑ. 93. මම තනියෙන් එළියට බැස්සේ ගරු සභාපතිතුමනි. එළියට බැහැලා අර ජනතාව එන්න නොදෙනකොට පළාත් සභාවට ඇවිල්ලා උද්ඝෝෂණය කරලා, 4.45 ට තමයි විදුලි බලාගාරයක් ඉදිකරන්නේ නෑ කියලා නිගමනයකට ආවේ ගරු සභාපතිතුමනි. ඒ වගේ මරුකන්ද විදුලි බලාගාරය හදනවා කියලා කියන්නේ ජනතාවගේ මළගම. ඒ ප්‍රදේශයේ ජීවත් වෙන ජතාවගේ ආර්ථිකය නැති කිරීම. නීතිය උල්ලංඝණය කිරීම. අවුරුදු 36 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට බදු ගෙවලා තියනවා නම් ප්‍රාදේශීය ලේකම්තුමාට පුළුවන්ද ඒ ඉඩම්වලින් කොටසක් දිස්ත්‍රික් ලේකම්තුමා නොදැනුවත්ව මේ විදිහට දෙන්න කියලා මම අහනවා ගරු සභාපතිතුමනි. මේක දිය යටින් මොනවා හරි කුමන්ත්‍රණයක් තියනවා ගරු සභාපතිතුමනි. ඒ වගේම මීටර් 800 ක් ගඟෙන් වතුර නොගහා බට දිගේ වතුර එනවා ගරු සභාපතිතුමනි. ගඟ වේලෙනවා. මේ අයගෙන් ප්‍රශ්න කරනකොට මේ අය කියනවා අපි ඉඩෝරය කාලෙට වතුර ගන්නේ නෑ

කියලා. යකෝ අපට ඉඩෝරය කාලෙට තමයි වතුර ඕනි. ඉඩෝරය කාලෙට විදුලි ඕනි. එතකොට තමයි විදුලිය කපන්නේ. ඒ විදුලිය කපනකොට අපට පැවුමට තමයි විදුලිය ඕන ගරු සභාපතිතුමනි. මෙතන ජනතාවත්, නිළධාරීනුත්, ආණ්ඩුවත් රවට්ටලා මේ අය විදුලි බලාගාරයක් ගහනකොට හරි විනාශයක් වෙනවා ගරු සභාපතිතුමනි.

ඒ වගේම අර මාළු වර්ග ඉන්නවා කියලා නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා කිව්වා වගේම ගෙවන්කර් කියලා ගෙම්බෙක් ඉන්නවා. මුළු ලෝකයේම බෝපත්

ඇල්ල, එතකොට සීතගඟුලට ආවේනික ගෙම්බෙක් එච්චරයි ඉන්නේ. පරිසරය සුරකින සතෙක් මේ ගෙවන්කර් කියන ගෙම්බා ගරු සභාපතිතුමනි. මේ එසේ මෙසේ කෙසේ වෙතත් තමුන්නාන්සේට මම මේ කියන්නේ මේ විදුලි බලාගාර තුනක් හදනකොට වෙච්ච හානිය මම හැමදාම එරත්නට ගියොත් ගරු සභාපතිතුමනි, බලනවා පාළම තුනට පුපුරලා තියනවා. දැනට අවුරුදු හයකට ඉස්සෙල්ලා පුපුරපු පාළම හිසකෙයියා ගහකින් පමණ තිබුණ එක අද මෙහෙම ඇඟිල්ලක් දාන්න පුළුවන් තරමට තුන් පොළකින් පුපුරලා ගරු සභාපතිතුමනි. කෝටි ගාණක් වටිනා පාළමක්. විදුලි බලාගාර හදන අය අපට පාළම දෙනවාද ? මේ දුප්පත් රටවල් වලින් එකක් වෙන ශ්‍රී ලංකාව, විදේශ ආධාර මත රැකෙන අපි, අපේ කෝටි ගාණක පාළම බිමට වැටුනාට පස්සේ කවුද හදලා දෙන්නේ. මේ පාළම ගැන තමුන්නාන්සේ මේ පළාත් සභාවේ වගකීමක් දරන අපේ අතුල කුමාර රාහුබද්ධ ඇමතිතුමා හරහා අධීක්ෂණයක් කරන්න කියලා මම ඉල්ලනවා ගරු සභාපතිතුමනි. පාළම හරියට මැදින් එක පොළක්, දෙපොළින් දෙපොළක්, තුන් පොළින් තුන් පොළක් පුපුරලා තියනවා. මාධ්‍යවේදී මහත්මයෙක් මම එක්ක ගියා. එතුමාට පෙන්නුවා මේ පාළම පුපුරලා තියන හැටි. මේ නිසා කෙසේ වෙතත් මේ කුරුගඟේ

විදුලි බලාගාරය ගැසීමට සම්පූර්ණයෙන්ම අපි විරුද්ධයි. මේ වර ගෙනාවේ පස්වෙනි වතාවයි විදුලි බලාගාරය තැනීම සම්බන්ධව සබරගමුව පළාත් සභාවට.

එහෙම නම් කවුරු මොනවා කිව්වත් මේ කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙල පරාජය කරලා, මරුකන්ද විදුලි බලාගාරය තැනීම නවත්වලා ඒ ප්‍රදේශයේ ජීවත් වෙන ජනතාවගේ ජන ජීවිතය සුරක්ෂිතව ආරක්ෂා කරන්න ඔබතුමාගේ වගකීම ඔබතුමා ඉටු කරන්න කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* Hon.Chairman
*Kanchana Jayarathna* ----------------
-------------------------------------------

ස්තූතියි ! ගරු සිරිපාල කිරිඇල්ල මැතිතුමාට. මීළඟට වරුණ ලියනගේ ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී වරුණ ලියනගේ*
*கௌரவ உறுப்பினர் வருண லியனகே* Hon.Member
*Waruna Liyanage* ------
-------------------------------------------------

ගරු සභාපතිතුමා ඇතුළු සියළුම අමාත්‍යවරු, සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමන්ලා ඇතුළු සියළුම මාධ්‍යවේදීන් සියළුදෙනාටම සුභ අලුත් අවුරුද්දක් වේවා ! කියලා ප්‍රාර්ථනා කරන ගමන්, ගරු සභාපතුමා මේ කාරණය සම්බන්ධයෙන් මම හිතන්නේ සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා වගේ කාරණා ගණනාවක් අපි කථා කළා පහුගිය

අවුරුදු ගණනාවෙම. නමුත් මේක අදත් ඇවිල්ලා තියනවා. ඒ නිසා ඇත්තටම ගරු සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා, මේ ගැන පරීක්ෂණයක් ඔබතුමාත් මේ වෙනකොට කරගෙන යනවා. අද දවසේත් පෙත්සම් කාරක සභාවේ මේක අද තියනවාද දන්නේ නෑ. කාරක සභාවේ තියන යෝජනාවක්. ඒ නිසා ඉතින් ඇත්තටම මේ සියළුදෙනාගේම ඉල්ලීම අනුව මට ඉදිරිපත් කළා ඒක පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරන්න කියලා. ඉතින් ඒ නිසා මම ඉදිරිපත් කරලා

දැන් ඒ පෙත්සම අහගෙන යනවා. නමුත් මේක දිගින් දිගටම ජනතාව පෙළගැහෙන්නේ අළුතෙන් මේ කර්මාන්තය පටන් ගැනීමක් නිසා වෙන්න ඇති කියලා අපි විශ්වාස කරනවා. මොකද අපි දන්නේ නෑ, සමහර දවස්වලට නවතිනවා. සමහර දවස්වලට එනවා. ඒ නිසා දැනුත් මේක ආපහු ඇති වෙන්න යනවා වගේ දැනෙනවා. මොකද අපි දැක්කා මේ මරුකන්ද ෆොටෝස් අපට එවලා තිබුණා. ඒවායේ දී පාළම් හදන්න හරි මොනවා හරි කොන්ක්‍රීට් දාන ෆොටෝස් වගයකුත් තිබුණා. ඉතින් ඒ නිසා ඇත්තටම ගරු සභාපතිතුමා මේක සභාවෙන් අපි නවත්වපු එකක්. ඒ නිසා අපි දිගටම කථා කරන්නේ නැතුව මේක අවශ්‍ය තැනට යොමු කරන එක තමයි වඩාත් සුදුසු වෙන්නේ. ඉතින් ඇත්තටම මේක අපට නවත්වන්න පුළුවන් ඇති කියලා අපි දන්නේ නෑ. අපි හැමදාම කථා කළාම අපට මේක නවත්වන්න බෑ කියලා තමයි කියන්නේ. ඒ නිසා ඇත්තටම අපේ ප්‍රාදේශීය සභාවෙන් මේකට අනුමැතියක් දීලා තිබුණා එදා. මම දන්නේ නෑ ආයේ නැද්ද කියලා. ඒ නිසා ප්‍රාදේශීය සභාවට අයිතියක් තියනවා මේ සඳහා අවසරය ලබාදෙන්න. පළාත් සභාවට අවසරයක් නෑ. නමුත් අපේ යටතේ තිබෙන ආයතනයක් නිසා මේකවත් අඩුම තරමේ අයින් කරවන්න ඕන. අපි මේ දුන්න ප්‍රාදේශීය සභාවේ අයිතිය නවත්වන්න ඕන. පළාත් සභාවේ ඉල්ලීමක් අනුව ප්‍රධාන ඇමතිතුමාලච්චා. ඉතින් ඒක තමයි අපි බලපොරොත්තු වෙන්නේ. අපට අදාළ කාරණය ඉෂ්ඨ කරලා දෙන්න. ඒ වගේම ගරු සභාපතිතුමනි, මේකේ අපට

දුන්නා විරෝධකරුවන් විශාල පිරිසක් අද මේ අවස්ථාවේ රැඳී සිටිනවා. මේ තියන කාරණා ගත්තාම පස්සේ ගරු සභාපතිතුමනි, අපට එන්නේ සාමාන්‍යයෙන් අපි ජීවත් වෙන්නේ මේ කෙටි කාලයයි. මේ කෙටි කාලය තුළ මේ වගේ දේවල් සිද්ධ වෙන්න බෑ කියන අදහස තයි අපි හැම තිස්සේම කථා කරන්නේ. මොකද ගරු සභාපතිතුමනි, අපි මානවයා ගත්තාම පස්සේ හෝමෝඉරෙක්ටස් ඉදලා හෝමෝසේපින් ඉදන් ගත්තාම පස්සේ මේ

ලෝකය බිහිවුනාම පස්සේ අපේ ඉන්න ජීවීන් ගත්තාම පස්සේ ලෝකයට හානි කරන ජීවීන් අපි ඇරෙන්න කවුරුවත් නෑ කියලා මම විශ්වාස කරන්නේ. මොකද ගරු සභාපතිතුමා, මේ ලෝකය පටන් ගත්තාම ඉතිහාසයේ කොච්චර සුන්දරව තියෙන්න ඇද්ද ? නමුත් දැන් එන්න එන්න ලෝකය සංකීර්ණ වෙලා මේ ලෝකයට හානි කරනම සත්වයා අපි බවට පත්වෙලා තියනවා නිකම්ම. ඒ නිසා අපි මේ ඉන්න ස්ථානයේ ඉදලා වචනයක් හරි කථා කරලා උදව් කරන්න පුළුවන් නම් මේ හානි නොකෙරෙන්න ඒක තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි දැක්කා මේකේ බෝපත් ඇල්ලේ උඩහා මේ වගේ තුනක් නිර්මාණය වෙලා තියනවා. මේ හතර වෙනි එක. එතකොට හතර වෙනි එක ගැහුවාම පස්සේ මේ ගඟේ වතුර යන්නේම නෑ. බටයක් අස්සෙන් තමයි යන්න වෙන්නේ. එතකොට ගරු සභාපතිතුමනි, අපේ තියන සුන්දරත්වය අර කිච්චා වගේ ජීවීන් මේ සියළු දේවල් අපට අහිමි වෙයි. ඉතින් ඒ නිසා මේ සුළු දෙයකින් මේවා ඔක්කෝම අහිමි කරගන්නවාද ? එහෙම නැත්නම් මේවා පවත්වාගෙන යනවාද කියන කාරණය තියෙන්නෙ. ගරු සභාපතිතුමනි, මේවා කරන්නම ඕන නම් මම කියන්නේ මේ රටට, එහෙම නැත්නම් මේ ලෝකයට මේවා කරන්නම ඕන නම් අඩුම තරමින් මේකේ තියනවා, මේ සටන් පාඨවල තියනවා, ගඟ විකුණා, බලාගාර හරහා කරගන්න වැඩක් අපට නැති නිසා, අපටත් නැහැනේ. ඒ නිසා වෙනවා නම් අඩුම තරමේ ප්‍රාදේශීය සභාවකින් හරි මේවා කරලා ගමේ

එහෙම නැත්නම් ප්‍රදේශයේ අයට යම්කිස ශක්තියක් වෙන වැඩ සටහනක්වත් තියෙන්න ඕන. කුණු ටික එකතු කරගන්න සල්ලිවල් එන්නේ මෙවැනි දෙයකින්. ඒ නිසා ආණ්ඩුවටම පුළුවන් මැදිහත් වෙලා ජනතාවට ප්‍රතිලාභයක් යන විදිහට ප්‍රාදේශීය සභාව තුළින්ම මේවා නිර්මාණය කරන්න. මොකද පෞද්ගලිකව දුන්නාම පස්සේ මේවා තමන්ට තමයි එන්නේ. කොච්චර තිබුණත් සල්ලි මදි.

ඉතින් ඒ නිසා තමන්ට මදි කියන කාරණාවනේ මේ එන්නේ. ඒ නිසා මේවා රජයේ සම්පත් සියළුදෙනාටම බෙදී යන්න ඕන. ප්‍රාදේශීය සභාවකින් හරි මේක කරන්නම ඕන නම් කරලා ජනතාවට සේවයක් ලබාගන්න මේ වගේ වැඩ සටහන් ක්‍රියාත්මක වෙන්න ඕන කියන අදහසේ මම ඉන්නේ. ඉතින් ඇත්තටම මේකට කරන්න පුළුවන් උපරිම ශක්තිය ඔබතුමා ලබාදෙයි කියලා විශ්වාස කරමින්, අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙමින් මේක නවත්වන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! වරුණ ලියනගේ මන්ත්‍රීතුමනි. මීළඟට යෙහියා එම් ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්* *கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම ඔබතුමාටත්, අමාත්‍ය මණ්ඩලයටත්, විපක්ෂනායකතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියටත්, ඒ වගේම සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ටත්, මාධ්‍යවේදීන්ටත් සියළුදෙනාට ලැබුවා වූ 2017 වර්ෂය සාමය, සතුට, සෞභාග්‍යයෙන් පිරි සුභම සුභ නව වසරක් වේවා ! කියලා ප්‍රාර්ථනා කරමින් අද දින මේ අවස්ථාවේ දී අපේ හිත මිත්‍ර නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද කාලයක් තිස්සේ මේ සම්බන්ධයෙන් උඩට එනවා. ආපහු මතු වෙනවා. ආපහු මේක පහළට ගිහිල්ලා දෛනිකව ලොකු ගැටළුවක් ප්‍රදේශයේ ජීවත් වෙන ජනතාවට පවතිනවා කියන රාවයත් සමඟම විවිධ අවස්ථාවල දී එම යෝජනාව මේ සභාව තුළත් සාකච්ඡා කරමින්, විවිධ අවස්ථාවල දී සම්බන්ධීකරණ කමිටුවලත් සාකච්ඡා කරමින්, අපි ගත් තීරණයක් එක අතක සම්මත වෙනවා. ආපහු නැවත ඒක පහළට ගිහිල්ලා ආපහු මේක ක්‍රියාත්මක වෙන තත්ත්වයට නැවත මතුවෙන මොහොතක් තමයි අද නැවත මේ අවස්ථාවේ දී අපි සාකච්ඡා කරන්නේ. විදුලිබල අර්බුදයට මුවාවී සමනල කන්ද අඩවියේ ජල මූලාශ්‍රය විනාශ මුඛයට ඇද වැටීමේ තර්ජනයෙන් බේරා ගැනීමට අතිගරු ජනාධිපතිතුමාට සම්මත කර යැවීම තමයි එතුමාගේ යෝජනාව. ගරු සභාපතිතුමනි, මේ ප්‍රදේශයේ මේ වෙනකොට විදුලි බලාගාර තුනක් ක්‍රියාත්මක වෙනවා. තවත් එකක් ක්‍රියාත්මක වීම තුළ අපි කාටත් තේරෙනවා දැනෙන දේ තමයි එකම ජල ධාරිතාවක් පහළට බැස යනකොට ඒ තුළින් ඒක කඩඉම් තුනකින් අරගෙන නැවතත් තව තැනකින් ගන්න ගිහාම මේ ජල මූලාශ්‍රය සම්පූර්ණයෙන් අපෙන් හිදී යනවා. ඒ වගේම තමයි අපි ස්වභාවිකව මේ ගලාගෙන යන ජල මූලාශ්‍රය

අපි මේ විදිහට කොන්ක්‍රීට්වලින් හා හියුම් පයිප්ප ආදී විවිධ දේවල් උපයෝගී කරගෙන ක්‍රියාත්මක කිරීම තුළ අපි දකින දෙයක් තමයි අපේ ස්වභාවික ඒ වගේම උල්පත් හිදී යනවා. අපි කවුරු මොන තරම් දේවල් කථා කළත්, මොන දේ කිව්වත් මේක කොන්ක්‍රීට්වලින් සමනය කරලා යනකොට අපේ උල්පත් ටික ටික හිදී යනවා. ඒ වගේම තමයි ස්වභාවිකව අපි ආරක්ෂා කරගත්ත, ඒ වගේම රැකගත්ත

පරිසරය මේ තුළින් විනාශ වෙනවා. අඩුම ගානේ ගිහිල්ලා පුද්ගලයෙකුට නාන්න තිබුණා නම් ඒ නාන්න තිබුණ අවස්ථාව හිඳිලා යනවා. තව පුද්ගලයෙක් ගිහිල්ලා පොඩ්ඩක් බොන්න හරි වතුර ටිකක් ගත්තා නම් ඒ අවස්ථාවත් මේ තුළින් අහිමි වෙනවා. සමහරවිට මේක කථා කරන කීප දෙනෙක් තමන්ට ඒ ප්‍රදේශයේ ඉඩම්වලට නොවටිනා වටිනාකමක් ලබාදෙනවා. මම දන්නවා සමහර තැන්වලට ගිහිල්ලා අපි කියපු රු.10,000/- ක් වටිනා ඉඩමට ලක්ෂ 10 ක් ලබා දෙනවා. ඔවුන් ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. තව පැත්තකින් ගිහාම තමන් ගැන විතරක් හිතන , අද ගැන විතරක් හිතන, සමස්තයක් වශයෙන් අපි ගත්තාම ගරු සභාපතිතුමනි, අපි බලන්න ඕන අපට වඩා අනාගතයේ දී හෙ රටේ ඊළඟ පරම්පරාව පිළිබඳ, ඒ වගේම මේ රටේ අනාගතය භාරගන්න ඉන්න උදවියට අපි කවදා හරි දවසක නිසි ආකාරයෙන් මේ රට භාරදීම තමයි සිදු කළයුත්තේ.

නමුත් අද කවුරු හරි උවමනාවකට විවිධ වාර්තාවල් දෙන්න පුළුවන්. මට පොඩි සැකයක් තියනවා අනුරප්‍රිය මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නමින් පරිසර අධිකාරියට ලිපියක් ගිහිල්ලා තියනවා කියලා ආරංචියක් තියනවා. ඇත්ත නැත්ත ඔබතුමාගෙන් තමයි අහන්න ඕන. මේ සම්බන්ධයෙන් ඔබතුමා කැමැත්ත දීලා තියනවා කියන එකත් මට තොරතුරක් ලැබිලා තියනවා. මේක ඔබතුමා නොදැනුවත්කම නිසා එදා විරුද්ධ වුනත් මම සත්‍ය දන්නේ නෑ. මට ඒ ෆැක්ස් එක ගෙන්වා

ගන්න පුළුවන් තත්ත්වයක් තියනවා. නමුත් මට පොඩි සැකයක් තියනවා. ඔබතුමාගේ හෘද සාක්ෂිය දන්නවා. ඔබතුමා දන්නවා........

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*** *ගෞරව*
*நமிந்த அனுரபிரிய* *Hon.Member Naminda Anurapriya* ------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව පිළිතුරක් ලබාදිය යුතුයි. ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව අපට දැනුවත් කරලා තිබුණා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතියක් අරගෙන තියනවා කියලා. නමුත් එහෙම අනුමැතියක් අරගෙන නෑ. අපි කිව්වා මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථානීය පරීක්ෂණයක් කරලා වාර්තාවක් අරගෙන තියනවා. නමුත් එහෙම පී.අයි.ඊ. වාර්තාවක් අරගෙන තියනවා නම්, ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වගේම සියළු ආයතනවල නිර්දේශ තියනවා නම් ඉතින් අපට කරන්න දෙයක් නෑ. නමුත් අපි ඒකට විරුද්ධයි. ඒගොල්ලෝ දීලා තියනවා නම් අපට කරන්න දෙයක් නෑ. නමුත් ගරු සභාපතිතුමනි, එහෙම වාර්තාවල් අරගෙන නෑ ස්ථිර වශයෙන්ම. ඒක වැරදියි. ඒක තමයි මම මතුකළ කාරණාව.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** *ගෞරව*
*உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.Member M.Y.M.Iflar* ----------------------------------------

මම මේකට තදින් විරුද්ධයි. වෙන එකක් නෙමෙයි, මම සාමාන්‍යයෙන් පරිසරයට ආදරය කරන, ඒ වගේම අපි පුංචි පවුල්වලින් ඇවිල්ලා අද ඉහළ තත්ත්වයේ හිටියත් සාමාන්‍ය ස්වභාව ධර්මයට, ඒ වගේම

පරිසරයට කැමතියි. නමුත් මම මේක ඇහුවාම ඔබතුමාම මේකට යවලා තියනවා කිව්වා, මම ෆැක්ස් යන්ත්‍රය මඟින් ගෙන්වා ගන්න හැදුවා. මොකද අද දිනයේ මට උවමනාව තිබුනේ. නමුත් එහෙන් දැන ගන්න තිබුණ දේ තමයි අතපසු වීමකින්,

නොදැනුවත් කමින්, මේ පිළිබඳ අවබෝධයක් නැති නිසා මම මේකට එදා විරුද්ධ වුනා. අද කැමතියි කියන තත්ත්වයක්, ඒ තත්ත්වයේ තියනවා කියන එක එහේ දැන ගන්න තියනවා. නමුත් ගරු සභාපතිතුමනි, මේකේ කණ්ඩායමක් ඉන්නවා විරුද්ධව. ඒ පැත්තේ තමයි මමත් ඉන්නේ. මේක ගත්තාම සමහරු හිතයි දේශපාලන පැත්තෙන් විවිධ දේවල්. අපට දේශපාලනයට වඩා සමාජයේ ජීවත් වෙන්න ඕන. රටක් විදිහට ජීවත් වෙන්න ඕන. හරි දේ හරි විදිහට දකින්න පුළුවන් තත්ත්වයක් තියෙන්න ඕන. කවුරු කළත් වැරදියි. මේකේ සමහර උදවිය අපටත් සමහර අවස්ථාවල කියනවා, ගමේ කීප දෙනෙකුට රස්සාවල් හම්බ වෙනවා. අපේ ගමේ පාසලට, නැත්නම් පන්සලට කීයක් හරි ආදායමක් ලැබෙනවා. එහෙමත් නැත්නම් කියනවා අපේ දරුවන්ට පොත් ටිකක්, සපත්තු ටිකක්, බෑග් ටිකක් ලබාදෙනවා. එහෙමත් නැත්නම් අපේ හෘද රෝගියෙකුට, ඒ වගේම රෝගී තත්ත්වයට පත් වුනාම ඒ අයට ආධාර උපකාර ලබාදෙනවා මේක නිසා කියලා. අපට ඒක නෙමෙයි වටින්නේ. අපට වටින්නේ මේ දේ නැති වුනාට පස්සේ කිසිම දෙයක් ලැබෙන්නේ නෑ. මේකෙන් වෙන්නේ එක කුඩා කණ්ඩායමක් ජීවත් වෙනවා. මේ අපි කවුරු හරි කථා කළොත් මේ වෙනකොට අපි දන්නවා ජල විදුලි බලාගාර පිළිබඳව තියන විශ්වාසය දැන් ටික ටික අපෙන් නැති වීගෙන යනවා. එකක් අද තාක්ෂණය දියුණුයි. සුළං වලින් අපට ලබාගන්න පුළුවන්. හිරු එළිය තුළින් සෝලා යන්ත්‍ර මඟින් අපට ගන්න පුළුවන්. ලංකාවට ලේසිම එක තමයි හිරු එළිය. ඉදිරියේ දී අපි බලාපොරොත්තු වෙනවා නියං කාලයක් පත් වෙන්නේ. එවැනි අවස්ථාවල දී ලංකාවට වැඩියෙන්ම ප්‍රයෝජනවත් වෙන , ඒ වගේම ඉතාමත්ම පහසුවෙන් ලාභයට ගන්න පුළුවන් දේ තමයි, කිසි කෙනෙකුට හානියක් නොවෙන දෙයක් තමයි මේ හිරු එළියෙන් ලබාගන්න විදුලිය සෝලා කියන මේ යන්ත්‍රයෙන්. මේවා ගැන යන්නේ නැතුව මේකට අපි නැඹුරුවීම ඉතාම වැරදියි.

ඒ නිසා මම දීර්ඝ වෙලාවක් කථා කරන්නේ නෑ. මොකද අපි වැඩි වෙලාවක් මේකේ අපි කථා කරලා තියනවා. මේ සම්බන්ධයෙන් අපි දෙගොල්ලොම දන්නවා. අපට තියන එකම දේ තමයි හැකි ඉක්මණින් මේක ජනාධිපතිතුමාට සහ මොකද අපි මේ වෙනකොට දන්නවා මේ පිළිබඳව වාර්තාව සහ සාකච්ඡාව පවතින්නේ මෙතෙක් අවසන් නොවිච්ච, ආරම්භ කරපු අවසන් නොවිච්ච ටික ඉවර කිරීම සඳහා තමයි බලාපොරොත්තු වෙන්නේ. නමුත් මේකේ විරුද්ධත්වය සහ මේකේ තියන හානිය, මේකේ තියන බරපතලකම අපි දැනුවත් කළාම නියත වශයෙන්ම ඒක නවතිනවා.

ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ පිළිබඳව දැනුවත් අපේ මේක සභාවේ යෝජනාවක් වශයෙන් සම්මත කරලා මේක අතිගරු ජනාධිපතිතුමා පරිසර ඇමතිවරයා වශයෙන් දැනුවත් කරලා කඩිනමින් අවශ්‍ය කටයුතු සකස් කරලා දෙන්න කියලා ඉල්ලමින් මම ඔබතුමා අවස්ථාව සලසාදීම පිළිබඳව අනේක වාරයක් ස්තූතිවන්ත වෙමින් මේ යෝජනාව කඩිනමින් ක්‍රියාත්මක කිරීමට ශක්තිය ධෛර්‍ය ලැබේවා යැයි ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* Hon.Chairman
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

ස්තූතියි ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමාට. මීළඟට අකිල සාලිය එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට.

***ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.***

*கௌரவ உறுப்பினர் அகில எல்லாவல Hon. Member Akila Ellawala*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි ලැබුවා වූ නව අවුරුද්ද සර්වප්‍රකාරයෙන්ම සාර්ථක අවුරුද්දක් වේවා කියලා සියළු දෙනාටම ප්‍රාර්ථනා කරමින් නමින්ද ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන මේ යෝජනාව ස්ථිර කරමින් තමයි මම මේ යෝජනාවට එක් වෙන්නේ. ගරු සභපතිතුමනි මේ පිළිබඳව වැඩි තාක්ෂණ දැනුමක් මට නැති වුණත් මේ යෝජනාව පිළිබඳව මීට අවුරුදු දෙකකට තුනකට ඉස්සෙල්ලාත් මේ සභාවේ අර සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා කිව්වා වගේ හය පාරකට වැඩි ප්‍රමාණයක් මේ යෝජනාව මේ සභාවට ඉදිරිපත් වෙලා තියෙනවා. මේකේ තියෙන අතිශයින්ම භයානක තත්ත්වය ගැන . නමුත් අපි කතා කරනවා අපි කෑගහනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණයේත් කතා කරනවා. එහිදීත් මේ පිළිබඳව වාද විවාද වෙනවා. ඒකට විරුද්ධව වැඩි හරියක් ප්‍රකාශ කරනවා. පළාත් සභාවේ පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව සියළු දෙනාම මේකට විරුද්ධව කතා කරනවා. නමුත් අරහේ ගොඩනැගිලි ඒ ආකාරයටම ඒ දින ආකාරයටම සිද්ධ වෙලා ඉවරයි. මං හිතන්නේ මේක අපි කොච්චර කතා කළත් කොච්චර මෙතන වාද විවාද වුණත් වැඩක් නැහැ මෙහි තියෙන ව්‍යාපෘති

ක්‍රියාත්මක කරන්න බෑ සාමාන්‍ය ව්‍යාපාරිකයින්ට. මං හිතන්නේ නෑ රත්නපුර ප්‍රදේශයේවත් කෑගල්ල ප්‍රදේශයේවත් මේ ආකාරයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ බලය ,ශක්තිය සහ දැවැන්ත සම්බන්ධකම් තියෙන ව්‍යාපාරිකයින්. මේ ව්‍යාපාරිකයෝ තමයි මේවා කරන්නේ. අපි ජනතා නියෝජිතයින් හැටියට මේවා අනුමත කරනවා නම් අපේ නිළධාරීන් මේවා නොදැනුවත්කමින් මේවා අනුමත කරනවා නම් අපි කරන වැරැද්ද මේ පරම්පරාවට නෙමෙයි අපේ අනාගත පරම්පරාවට තමයි මේ වැරැද්ද අපි කරන්නේ. අපි කොච්චර මෙතන කෑගැහුවත් වැඩක් නෑ අර අපේ අපි මොන දේශපාලන මතිමතාන්තරවල හිටියත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිතුමා විදිහට පරිසරය පිළිබඳ විශේෂ දැක්මක් විශේෂ වුවමනාවක් එතුමාට තියෙනවා මේ පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා. ඒ නිසා මේ පිළිබඳව විශේෂ සාකච්ඡාවක් ඔබතුමා හරි එතුමාගෙන් වෙලාවක් ඉල්ලගෙන මේ පළාත් සභාව තුළ මේ සාකච්ඡා වෙච්චි කරුණු පිළිබඳව එතුමා දැනුවත් කළා නම් මීට වඩා වැඩි ප්‍රතිඵලයක් ගන්න හැකි වෙයි. එහෙම නැති වුණොත් කොච්චර කෑගැහුවත් වැඩක් නෑ. මේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ කතා කළත් වැඩක් නෑ. නිළධාරීන් සහ මේ ව්‍යාපාරිකයන් එකතු වෙලා මේ ව්‍යාපෘතිය ඒ අවශ්‍ය විදිහට කරගෙන යනවා. ඒ නිසා අද මේ වෙන්න යන වින්නැහියවත් නවත්තන්න අපි මේ සභාවේ කතා කරන දේ ඔබතුමාට යුතුකමක් තියෙනවා මම විශ්වාස කරන විදිහට මේ පිළිබඳව අවශ්‍ය පාර්ශවය දැනුවත් කරලා ඉතාම ඉක්මනින්ම කඩිනමින්ම මේ ව්‍යාපෘතිය නවත්තන්න. මොකද අද හෙටම අපේ ඉතිහාසයේ අවුරුදු 40 කට පෙර ආපු නියගයක් බලාපොරොත්තුවෙන් ඉන්නවා ශ්‍රීලංකාව. නියගයක් ආවොත් එහෙම මේ ප්‍රදේශයේ පවුල් පහළොස්දාහක් ,විසිදාහක් ජීවත් වෙනවා. කොහොමද මේ මිනිස්සු ජීවත් වෙන්නේ. අපේ අර නමින්ද මන්ත්‍රීතුමා කිව්වා වගේ මත්ස්‍ය සම්පත ලෝකයේ

සමහරක් ජෛව විවිධත්වය තියෙන්නේ මේ ප්‍රදේශයේ විතරයි. ඔක්කෝම මේ සත්වයින් ජනතාව ජීවත් වෙන්නේ කොහොමද.

ඒ නිසා අපිට විදුලිබලය අවශ්‍යයි. අපි නෑ කියන්නේ නෑ. අපි සමතුලිතව බලන්න ඕනේ. ඒක නෑ කියන්නේ නෑ. මං හිතන්නේ නෑ තව වසර ගණනාවක් මේ ජල ව්‍යාපෘති කරන්න පුළුවන් වෙයි කියලා. මොකද මේ උත්තරධ්‍රැවයේ හිම කඳු දිය වෙලා වැටෙනවා. අද ලෝකයේ උෂ්ණත්වය දවසින් දවස වැඩි වෙමින් පවතිනවා. අද බීමට තියෙන ජලය අද නැති වෙමින් පවතිනවා. ඒ නිසා වැඩි කාලයක් මේ ජල විදුලිබලාගාරය ඉදිකිරීමට අවස්ථාව හම්බ වෙන්නේ නෑ. දැන් ජල විදුලිබලාගාර අයින් කරනවා. නමුත් අපිට තියෙන ලොකුම සම්පත තමයි තමයි ඉෆ්ලාර් මන්ත්‍රීතුමා කිව්වා වගේ සෝලා හිරු ආලෝකය නැත්නම් විකල්ප බලශක්ති ඕන තරම් තියෙනවා හඳුන්වලා දීලා. අපි ඒවාට යන්නට ඕනේ. එහෙම නැතුව අපේ ගඟවල් ටිකම හරස් කරලා එහි තියෙන ජලය ටික ජනතාවට බීමටත් නැති කරලා කරන එක නෙමෙයි වැඩක් කියන එක මම විශ්වාස කරනවා. ඒක නිසා ගරු සභාපතිතුමනි මේ ව්‍යාපෘති දැන් තුනක් ආරම්භ කරලා තියෙනවා. මේ හතර වෙනි එකවත් ආරම්භ නොකරන්න සම්පූර්ණ අපේ විරෝධය ප්‍රකාශ කරන ගමන්ම මං හිතන්නේ මෙතන දේශපාලනයක් නෑ, මේ ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයද, ශ්‍රීලංකා නිදහස් පක්ෂයද ,ජේවීපී ද මේ සියළුම පක්ෂ නියෝජනය කරන සියළුම ආගම් ද,හැම ජාතියද ,හැම පුද්ගලයාටම මෙහි තියෙන තත්ත්වය උග්‍ර අතට හැරිලා තියෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව මම මේ සභාවට යෝජනා කරනවා ඔබතුමාට යෝජනා කරනවා ඉතාමත්ම කඩිනමින් අතිගරු ජනාධිපතිතුමාව දැනුවත් කරලා එතුමා හරහා මේ ව්‍යාපෘතිය ආරක්ෂම කරලා ගන්න තියෙන තීන්දු තීරණ අරගෙන ජනතාවට අහිතකර බලපෑම් නැති වෙන්න පරිසරයට අහිතකර බලපෑම් නැති වෙන්න ඒ තියෙන ජෛව විවිධත්වයට අහිතකර බලපෑම් නැති කරලා මේ ව්‍යාපෘති කරාට කමක් නෑ. මම ඉස්සෙල්ලා කිව්වා වගේ ව්‍යාපෘතියත් අවශ්‍යයි මෙතන නෙමෙයි වෙනත් ස්ථාන තියෙනවා. ජනතාව නැති ජනතාව අපහසුතාවයට පත් වෙන්නේ නැති ස්ථාන තියෙනවා. ඒ ස්ථාන ඕන තරම් මේ ලංකාවේ තියෙනවා. මේවගේ ස්ථානයක් ගන්න. නැතුව මේ ජනතාව බහුල ප්‍රදේශවල මෙවැනි ව්‍යාපෘති පටන් ගත්තහම මෙවැනි උග්‍ර තත්ත්ව ඇති වෙනවා. එසේ කියමින් මගේ විරෝධය ප්‍රකාශ කරමින් ඒවගේම මේ අවස්ථාව ඔබතුමා මට ලබාදීම පිළිබඳව ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*

*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* Hon.Chairman

*Kanchana Jayarathna* ----------------

--------------------------------------------

ස්තුතියි ගරු අකිල සාලිය එල්ලාවල මන්ත්‍රීතුමනි. මීළඟට ගරු කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක* *கௌரவ*

*உறுப்பினர் கே.எல்.ரத்நாயக* Hon.Member

*K.L.Ratnayake* --------------

-----------------------------------

ගරු සභාපතිතුමනි ඔබතුමා ප්‍රදාන දේශපාලන අධිකාරියේ සියළු දෙනාටත් ඒවගේම ප්‍රධාන ලේකම්තුමා ප්‍රදාන ඒවගේම අපේ නව සභාලේකම්තුමා ප්‍රදාන නිළධාරී මහත්ම මහත්මීන්ටත් , ජනතාවටත් සුභ නව වසරක් වේවා යැයි ප්‍රාර්ථනා කරනවා ප්‍රථමයෙන්ම. ගරු සභාපතිතුමනි කුඩා

විදුලිබලාගාරය හදන එකට කොහොමත් විරුද්ධයි. ගරු සභාපතිතුමනි අපේ සමාජයේ ජනතාව නැතිනම් ව්‍යාපාර කරන පුද්ගයෝ ඉන්නවා යම් යම් පුද්ගලයෝ බල්ලෝ මරලා හරි කමක් නෑ සල්ලි හම්බ කරන්න පුළුවන් නම් ඒක තමයි කරන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ කුඩා විදුලිබලාගාරය ඇති කළා කියලා ජාතික පද්ධතියට එකතු කරන කාරණාව තමයි කරන්නේ. මේ වගේ ඇහැලියගොඩත් එකක් හැදුවා ඔබතුමාත් දන්නවා නැදුරන. ජනතාවගේ විරෝධයක් තිබුණා. දේශපාලන අධිකාරියේ යම් යම් අයගේ විරෝධයක් තිබුණා. ඒත් මුදල් මත පදනම් කරගෙන ඒකට අවසරය ලබා දෙන්න කටයුතු කරනවා. අද වෙන කොට නැදුරන ප්‍රදේශයට වතුර නෑ . නාන්න ජලය නෑ. ඒවගේම තමයි මේ විදුලිබලාගාරය. අර කිව්වා ප්‍රාදේශීය සභාව අවසරය දීලා තියෙනවා කියලා. අනිවාර්යයෙන්ම ප්‍රාදේශීය සභාවක අවසරය නැති නම් ඒ ව්‍යාපෘතිය කරන්න බෑ. එහෙම නම් මොන හේතුවටද මේකට අවසරය දීලා තියෙන්නේ. දැන් අපි මහ ලොකුවට කතා කරනවා පරිසරය ගැන. අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ පතල් කර්මාන්තය කරගෙන යන කොට බැකෝ ලයිසන් නතර කළා පරිසර හානි වෙනවා කියලා. ඉතිං අපි ජනාධිපතිතුමාට කියනවා පරිසර ඇමතිතුමා හැටියට මේක නතර කරන්න. මිනිසුන්ගේ විරෝධතාවය තියෙනවා. දේශපාලන අධිකාරියේ බහුතරයක විරෝධතාවය තියෙනවා නම් ජනාධිපතිතුමාට ගරු සභාපතිතුමනි ලියන්න මේක නතර කරන්න කියලා. ප්‍රාදේශීය සභාව අවසරය දුන්නද ,මධ්‍යම පරිසර අධිකාරිය අවසරය දුන්නද පරිසර ඇමතිවරයා හැටියට එතුමාට ඒක කරන්න පුළුවන්. මම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට ආදාහනාගාරයක් හදන්න හැදුවා ගරු සභාපතිතුමනි ඔබතුමා දන්නවා දන්දෙනිය කනත්තේ. ජනතාව විරුද්ධ වුණා. මිනී අලු ගිහිල්ලා ළිං වලට වැටෙනවා. වතුර ටැංකිවලට වැටෙනවා කියලා. එදා මොකක්ද මධ්‍යම පරිසර අධිකාරිය කළේ. ඇවිල්ලා වටේ ඉන්න මිනිස්සුන්ගෙන් ඇහුවා මේකට විරුද්ධද කියලා. විරුද්ධයි කිව්වා. මධ්‍යම පරිසර අධිකාරියේ වාර්තාව විරුද්ධයි. ඕන් තත්ත්වය. එතකොට මධ්‍යම පරිසර අධිකාරිය දැන ගන්නට ඕනේ. මෙච්චර හානියක් වෙනවා නම් මේකට අවසර නොදී ඉන්න. කුඩා විදුලිබලාගාර ගහන එකෙන් සිද්ධ වෙන්නේ අතිශය පරිසර හානියක්. වතුර ටික නැති වෙනවා. තියෙන මත්ස්‍ය වර්ග නැති වෙලා යනවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි මේක අපි පළාත් සභාවක් හැටියට අපේ පළාත් පාලන ඇමතිවරයා හැටියට විෂයභාර අමාත්‍යවරයා හැටියට ගරු ප්‍රධාන ඇමතිතුමාත් එක්ක කතා කරලා මේක අනිවාර්යයෙන් නතර කරන්න කටයුතු කළ යුතුයි. බල්ලෝ මරලා හරි හම්බ කරන මිනිස්සුන්ට මේක කරන්න අපිට අවශ්‍යතාවයක් නෑ. කොච්චර තිබුණත් මැරෙන කොට ගෙනියන්න වගේ. ඒ නිසා ගරු සභාපතිතුමනි මේක එක්කෙනෙක්ගේ දෙන්නෙක්ගේ වුවමනාවට නැත්නම් දේශපාලන අධිකාරිය වෙනස් වෙන්නට පුළුවන්. ආණ්ඩු වෙන්නට පුළුවන්. පහුගිය ආණ්ඩු එන කොට ඒ කට්ටියට සල්ලි බෙදන්න පුළුවන්. වටේ ඉන්න ඡන්දදායකයාට. එහෙම නැත්නම් මේ ආණ්ඩුව ආවහම මේදේ කර ගන්න මේකේ ඉන්න ඡන්දදායකයාට සල්ලි බෙදන්න පුළුවන්. ඒක නෙමෙයි ඇත්ත තත්ත්වය වටහාගෙන මේවා නතර කළ යුතුයි. ඔක්කෝම කියන්නේ ඒකයි. ඒ නිසා ගරු සභාපතිතුමනි මේක දිගින් දිගටම මේකෙ තියෙනවා මේ කාරණා ටික මේ ජනතාව පත්‍රිකාවක් හැටියට සකස් කරලා එවලා

තියෙනවා. මේ කරුණු ටික කතා කරන්න ගියොත් පැය එක හමාරක් විතර කතා කරන්න වෙනවා. මේ කරුණු ටික දිහා සලකා බලලා අනිවාර්යයෙන්ම අපි පළාත් සභාවක් හැටියට අතිගරු ජනාධිපතිතුමාට පරිසර ඇමතිතුමා හැටියට මේක දැනුවත් කරලා කටයුතු කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
---------------------------------------------

ස්තුතියි ගරු කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමනි. මීළඟට සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී සමිත ආටිගල*
*கௌரவ உறுப்பினர் சமித ஆடிகல* *Hon.Member*
*Samitha Atigala* -----------
----------------------------------

ගරු සභාපතිතුමනි අපිට මේ කාලයේ ස්වභාවික විපත් පිළිබඳව නිරතුරුවම අහන්න ලැබෙනවා. මේවාගේ ස්වභාවික විපත් අපි දිගින් දිගටම අහන්න කැමති නෑ කියන එක මතක් කරන්නට ඕනේ. මේ ශෝකාන්තයෙන් අවසන් වෙන නොයෙකුත් ස්වභාවික විපත් පිළිබඳව පරිසරයට හානි කිරීම සම්බන්ධයෙන් අපිට නොයෙකුත් අත්දැකීම් තියෙනවා. මෑත කාලයේ අපිට අහන්න ලැබෙන නාය යෑමේ හේතුවෙන් විශාල ජනතාවක් මරු මුවට පත් වුණා. පීඩාවට පත් වුණා. නිවාස අහිමි වුණා. ඒවගේ විපත් පිළිබඳව නිරතුරුවට සැලකිලිමත් විය යුතුයි කියන ප්‍රකාශය කරන්න කැමතියි. ගරු සභාපතිතුමනි අපි දන්නවා මේවගේ ව්‍යාපෘති හේතුවෙන් රටේ සංවර්ධනයට යම් දායකත්වයක් ලැබෙනවා. ඒ වුණාට අපි විශ්වාස කරන්නේ ඒ සංවර්ධනය කියන එක පොළොවට දරා ගත හැකි සංවර්ධනයක් වෙන්නට ඕනේ. එරත්න ප්‍රදේශය කියන්නේ කඳු වලින් සමන්විත ප්‍රදේශයක් දැනටත් තුනක් ඒ ප්‍රදේශයේ කුරු ගඟ ආශ්‍රිතව ගොඩ නගලා තියෙනවා. මේ විදිහට දිගින් දිගටම ගියොත් එහෙම නාය යෑමේ අවධානමක් තියෙනවා කියලා අපිට විශ්වාසයක් තියෙනවා. ඒවාගේම අපි දන්නවා ව්‍යාපෘති යටතේ විශාල ලෙස හානි වුණ ජනතාවක් ඌව පළාතේ සිටිනවා.

ඒවාගේම අපි සඳහන් කරන්න ඕනේ භූ කම්පන හේතුවෙන ගෙවල් ඉරි තැලීම් වලට ලක් වෙන ඒවගේම ජල උල්පත් සිඳී යන අවධානමක් අපිට තියෙනවා කියන එක සඳහන් කරන්න ඕනේ. ඒවගේම අපි කියන්නට ඕනේ පරිසරය අවධානමට ලක් කරමින් මේ වගේ ව්‍යාපෘති කිරීමේ අවශ්‍යතාවයක් නැහැ. වර්තමාන රජය සූර්යය බල සංග්‍රාමය නමින් විශාල වැඩ පිළිවෙලක් ආරම්භ කරලා තියෙනවා. ඒ අනුව විදුලිබල ගරු අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මැතිතුමා ඒවගේම අජිත් පෙරේරා නියෝජ්‍ය අමාත්‍යවරයා එතුමන්ලාගේ මැදිහත්වීමෙන් ඒ සූර්යබල සංග්‍රාමය සෑම කුඩා නිවසක්ම විදුලිබලාගාරයක් බවට පරිවර්තනය කිරීමේ වැඩ සටහනක් තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ අනුවත් අපි ඒ වැඩ සටහන් යටතේ විශාල සූර්ය බල නිෂ්පාදනයක් සෑම විදුලිබල පද්ධතියට ඒකරාශී කිරීමේ හැකියාව තියෙනවා. ඒක වර්තමානයේ පවතිනවා. අන්න ඒවගේ විදුලිබලය සම්බන්ධයෙන් ඉදිරියේදී අපි විශ්වාස කරනවා ඒ විදුලිබල පැනල් මාර්ගයෙන් නිෂ්පාදනය වෙන විදුලිබලය නිසා ජාතික පද්ධතියට විශාල දායකත්වයක් ලබා දෙයි. ඒක නිසා අපි සඳහන් කරන්න ඕනේ මේවගේ පරිසරය

අවධානමට ලක් වෙමින් මේවගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා නම් ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න ඕනේ කියලා සඳහන් කරමින් නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමාට අපි ස්තුතිවන්ත වෙනවා මේවගේ යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන් එතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කතාව අවසන් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
----------------
--------------------------------------------

ස්තුතියි ගරු සමිත ආටිගල මන්ත්‍රීතුමනි. මීළඟට අජිත් කුමාර මැද්දේගම ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார* *Hon.Member Ajith Kumara*
--------------
---------------------------------------------

ගරු සභාපතිතුමනි ඔබතුමා ඇතුළු සියළු දෙනාට සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒවගේම නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ යෝජනාව ස්ථිර කරනවා. එතුමා 157 ( අ) වගන්තිය යටතේ තමයි එතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ. එතුමාට හැකියාව තියෙනවා පොදු වැදගත්කමකින් යුක්ත මේ යෝජනාව පළාත් සභාවට ඉදිරිපත් කරන්නට. අපිට ඒ විෂය අදාල නොවුනත්.

ඒවගේම ගරු සභාපතිතුමනි අපිට දැන ගැනීමට ලැබිලා තිබෙනවා මේ වර්ෂයේ මැත භාගයේ විතර ඉඳලා දීර්ඝ කාලයකට නියගයකට මුහුණ පාන්න යනවා කියලා. එවැනි විද්‍යාත්මක ගැනුම ඇති පුද්ගලයන් අදහස් ප්‍රකාශ කරලා තියෙන මොහොතේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඇතුළු පිළිගත හැකි දෙපාර්තමේන්තු වලින්. මෙවැනි යෝජනාවක් ක්‍රියාත්මකවීමෙන් අපේ විශාල වශයෙන් හානි වෙන්න පුළුවන්. ඒ ශ්‍රීපාද අඩවියේ සම්බන්ධයෙන් තියෙන ජල උල්පතක් දිය ඇල්ලක් සම්බන්ධයෙන් පමණක් තියෙන නෙමෙයි. මේ පළාත තුළ තියෙන අපිට අයිතියක්ව තිබෙන සෑම ජල උල්පතක් සම්බන්ධයෙන්ම මේ යෝජනාව සම්බන්ධ කරන්න අවශ්‍ය වෙනවා. විශේෂයෙන් අපි දන්නවා අඩි පහනක් හැටක් ,සීයක් පහළට වතුර ගලාගෙන එන තැනක් අහු වුණොත් එතන විදුලිබලාගාරයක් ගහන්න හදනවා. ඔබතුමාට මතක ඇති අපි යෝජනා කළ හඳගිරිඇල්ල. අපේ සංචාරක ව්‍යාපාරයටත් බොහොම තුඩු දෙන සංචාරක විෂය භාර අපේ පළාත් සභාවේ ඇමතිතුමා. අතුල කුමාර රාහුබද්ධ ඇමතිතුමා ඒ ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කරමින් ඒක සංචාරක පුරවරයක් බවට පත් කරගෙන යනවා. නමුත් අපි මේ සභාවේත් යෝජනා ගෙනල්ලා නොයෙකුත් නොයෙකුත් විදිහේ යෝජනාවල් ගෙනල්ලා නැවැත්තුවත් අද විශේෂ ව්‍යාපෘති ඇමතිවරයාට ඉදිරිපත් කරලා මේක ක්‍රියාත්මක කළා. විශේෂ ව්‍යාපෘති භාර අමාත්‍යවරයා. පළාත් සභාවේ නෙමෙයි මහ ආණ්ඩුවේ. අමුණුගම ඇමතිවරයාට. එවැනි යෝජනා අපි යෝජනා කරලා ඒකට විරුද්ධව අවශ්‍ය තැන් වලට සම්බන්ධ කෙරුවත් සමහරවිට අර වරුණ මන්ත්‍රීතුමා කිව්වා වගේ වෙනත් පාරවල් වලින් ගිහිල්ලා අල්ලගෙන ගිහිල්ලා යම් යම් විදිහේ දැන් අපේ අනුරප්‍රිය මන්ත්‍රීතුමා කිව්වා එතුමා එහෙම ලිපියක් ඉදිරිපත් කරලා නෑ කියලා. නමුත් එහෙම ලිපියක් තිබෙනවා. එහෙම අනුමැතිය දීලා. සමහර තැන්වල මෙවැනි අනුමැතිය දීමේ ලිපි තිබෙනවා. හැබැයි ආයතනයේ ප්‍රධානියා කියනවා අපි ලියුමක් දුන්නෙ නෑ කියලා.

කොච්චර විරෝධතා තිබුණත් එවැනි දේවල් කර ගන්න වෙනත් මාර්ග වලින් කර ගන්න වුවමනා කට්ටිය ගමන් කරනවා. විශේෂ අවධානයක් යොමු කිරීම අත්‍යාවශ්‍ය වෙනවා ප්‍රධාන ඇමතිතුමා මේ අවස්ථාවේ හිටියා නම් හොඳයි. මොකද අපේ පළාත තුළටත් අර බලපාන නියඟය බලපානවා. අපේ පළාත තුළ කියලා වෙනස් වෙන්නේ නෑ. සාමාන්‍ය දැන ගැනීමේ හැටියට මාස පහළොවකට වැඩි ප්‍රමාණයක් නියඟය තියෙයි කියලා තමයි විශ්වාස කරන්නේ. එවැනි කාලයක් වුණොත් අපේ තියෙන තේ වගාව, වී වගාව ,අනිකුත් වගාව පමණක් නෙමෙයි පානීය ජලය පවා විශාල ප්‍රශ්නයකට මුහුණ පාන්නට සිද්ධ වෙනවා. වර්ථමානයේ මේ අවස්ථාවේත් කෑගල්ල දිස්ත්‍රික්කයේ පානීය ජල ප්‍රශ්නයක් තිබෙනවා. ඒක බෙදා හරින්න සිද්ධ වෙලා. මේ දින ගණනක් පායලා. ඒවගේම වැලිගෙපොල ප්‍රදේශයේ බලංගොඩ 27ප්‍රදේශයේ ඒ පානිය ජල ප්‍රශ්නයක් තිබෙනවා. ඉතිං මේ ජල උල්පත් ටිකෙන් ගලා එන ජල දහරාවල් හරස් කරලා මේ විදුලිබලාගාර සකස් කිරීම හෝ මොන යම් කටයුත්තක් කරනවා නම් ඒක අවධානම් සහිතයි මේ කාල පරිච්ඡේදයේ. ඒක නිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා මේ අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමාගේ මේ විදුලිබලාගාරය සමනළ කන්ද අඩවියේ මූලාශ්‍ර කරගෙන කරන ඒ බලාගාරය පමණක් නෙමෙයි. සියළුම ස්ථානවල විදුලිබලාගාර පමණක් නෙමෙයි වෙන මොනවා හරි කරනවා නම් විශේෂ අවධානය යොමු කරලා ඒක අපේ පළාත් සභාව තුළ පරීක්ෂණයට පත් කරලා කටයුතු කරන්න අවශ්‍ය වෙනවා. විශේෂ කාරණයක් ගැන අවධානය ලක් කරලා කියලා මතක් කරමින් තමයි මේ කාරණාව කතා කරන්නේ. ඒ නිසා ඉදිරි කාලයේදී අපිට අවස්ථාවක් ආවොත් අපිට කතා කරන්න වෙන්නේ විදුලිය ගැන නෙමෙයි. විදුලිය ජනනය කරන්න වෙනත් ක්‍රම තිබෙනවා. ඒ ජනනය කිරීමට ආණ්ඩුව ලොකුවට පෙළ ගැස්සීගෙන යනවා. මේ ප්‍රශ්නයත් එක්ක.

ඒක නිසා පානීය ජලය නැතුව ජනතාවට විශාල ප්‍රශ්නයක් වෙනවා. විශේෂයෙන් මේ කඳුකරයේ ජීවත් වෙන ජනතාවට ලබාදීම පවා විශාල අපහසුතාවයට පත් වෙනවා. ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරමින් පළාත් සභාවේ සියළු දෙනාගේම ප්‍රධාන ඇමතිතුමා ඇතුළු සියළු දෙනාගේම අවධානය යොමු කරමින් මේ යෝජනාව අනුමත කරන ගමන් මෙකී අනිකුත් යෝජනා පිළිබඳවත් මේ ආකාරයෙන්ම කටයුතු කරමින් විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන්න කියලා මතක් කරමින් නවතිනවා. බොහොම ස්තූතියි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* Hon.Chairman
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

ස්තූතියි ගරු අජිත් කුමාර මැද්දෙගම ගරු මන්ත්‍රීතුමාට. මීළඟට ගරු නිහාල් ෆාරුක් ගරු මන්ත්‍රීතුමා. එතුමා සභාවේ නැහැ. මීළඟට විපක්ෂනායක ඩබ්.සෝමදාස මැතතුමා.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස* *கௌரவ*
*எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
------------------------------------------------------------

ගරු නමින්ද අනුරප්‍රිය මැතිතුමා විසින් යෝජනා කරන මරුකන්ද විදුලිබලාගාරයට විරෝධය පෑමට අවස්ථාවක් ලැබිලා තියෙනවා. ඒ අවස්ථාව ලබා දුන්නු ගරු මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා. ඒවගේම ගරු සභාපතිතුමනි මම අවස්ථාවක් කර ගන්නවා 2017 නව වර්ෂයේ ගරු සභාපතිතුමාටත් ඒවගේම ප්‍රධාන ඇමතිතුමා

ඇතුළු මැති ඇමතිවරුන්ටත් ඒවගේම ගරු මන්ත්‍රීතුමියටත් ඒවගේම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් ඒවගේම ප්‍රධාන ලේකම්තුමා ඇතුළු පළාත් සභාවේ නිළධාරී මහත්ම මහත්මීන්ටත් ඒවගේම සභාවේ නව ලේකම්තුමියටත් ඒවගේම සබරගමු පළාත් සභාවේ විසිඑක් ලක්ෂයක් පමණ වෙන ජනතාවටත් මේ ලැබූ නව වසර සාමයෙන් සතුටින් පිරි නව වසරක් වේවා කියා මම පළමුවෙන්ම ප්‍රාර්ථනය කරනවා.

ඒ එක්කම මේ විදුලිබලාගාරය ගැන කතා කරන කොට ගරු සභාපති තුමනි කෑගලු දිස්ත්‍රික්කයත් රත්නපුර දිස්ත්‍රික්කයත් කඳු වලින් පහතට වැටෙන ජලය දිහා බලා බොහොම කෑදරයෙන් ඉන්න පිරිසක් මේ රට තුළ ඉන්නවා. අපි දකිනවා මේ දිස්ත්‍රික්ක දෙකේම මං හිතන්නේ සැහෙන ප්‍රමාණයක පුද්ගලික ව්‍යාපාර ගොඩ නගලා තියෙනවා. රජයේ ඒවා නෙමෙයි. රජයට ආදායම් එන ඒවා නෙමෙයි. රජයට විදුලිය ලබාදීලා මුදල් ලබා ගන්නා ක්‍රමය පුටුවේ ඉඳලා මුදල් හොයා ගන්නා ක්‍රමයකට අද අවනත වෙලා ඉන්න පිරිසක් ඉන්නවා. ඒ පිරිසගෙන් මං හිතන්නේ මරුකන්ද විදුලිබලාගාරයත් ඒ පුද්ගයෙක් හෝ සමාගමක් මේ වන කොටත් කටයුතු ආරම්භ කරලා තියෙන බවයි අපිට පේන්නේ. මේ අයට ගරු සභාපතිතුමනි අවශ්‍යතාවයක් නෑ. පරිසරය ආරක්ෂා කර ගන්න. පරිසරය මොන ආකාරයට නාස්ති වුණත් මහජන අදහස් වලට විරුද්ධ වුණත් එයට අවශ්‍යතාවය තියෙනවා මේ විදුලිබලාගාරය හදලා මුදල් තමුන්නට හෝ හම්බ කර ගැනීමේ චේතනාවක් . මේ ක්‍රමය ක්‍රියාත්මක කරන්න. අපි දකිනවා මට සිහිපත් වෙනවා විශේෂයෙන්ම කෑගලු දිස්ත්‍රික්කයේ විදුලිබලාගාරයක් ආරම්භ කරන කොට විරෝධතා රාශියක් ඇති වුණා. අපිත් ඒ අවස්ථාවට මුල් වුණා. ඒවගේම ජනතා විමුක්ති පෙරමුණත් ඒ කාලයේ හිටපු මහජන නියෝජිතයින් ඉදිරිපත් වුණා. ඒවගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් නියෝජිත කරපු මන්ත්‍රීවරු ගලිගමුව ආසනයේ කීප පොළක් ඉදිරිපත් වුණා. මේ විරෝධතාවය දැක්වූවා. එදා හිටපු නිළධාරීන් දිස්ත්‍රික්ක ලේකම්තුමිය මේකට විරුද්ධ වුණා. මේක සම්පූරණයෙන් නවත්තන තැනකට ආවා. නැවත ආයේත් ආයේත් කාලයක් යන කොට ආයෙත් නව නිළධාරීන් පත් වුණට පස්සේ ආයේත් ආරම්භ කරගෙන කොහොම හරි මේ විදුලිබලාගාරය ඒ කට්ටියට ගොඩ නගා ගන්න පුළුවන්කමක් ලැබුණා. ගරු සභාපතිතුමනි හරියට මේ අලු යට ගිනි තියෙනවා වගේ ක්‍රම ක්‍රමයෙන් මේකට යමක් ඉදිරිපත් කරන කොට ඒකට විරුද්ධ වෙන පිරිසක් ඉන්නවා නම් ඒක ආයේ නිවීගෙන යනවා. ආයේ නැවත අලුත් නිළධාරීන් එන කොට අලුත් දේශපාලඥයින් එන කොට මේ අයගෙන් ලබාගැනීම සඳහා කටයුතු කරන කොට නැවතත් මේක පත්තු වෙනවා. ආය් පරිසරයට ආදරය කරන ජනතාව මහජන නියෝජිතයින් නැවතත් ඉදිරිපත් වෙනවා. මේකට විරුද්ධ වෙනවා. නැගී සිටිනවා. කෑ කෝ ගහනවා. නමුත් ඒක යටපත් වෙලා කොහොම හරි ඒ අයගේ අවශ්‍යතාවය ඉටු කරගෙන තියෙනවා කියන එක පැහැදිලිවම අපි කියන්නට ඕනේ. ඒ නිසා මම කියන්නට කැමතියි මේ මරුකන්ද විදුලිබලාගාරය මේක නතර කරන්නට ඕනේ. මේක නතර කරන තැනකට අපි සටන් කරන්නට ඕනේ. මොකද මෙහෙම නැත්නම් අපේ දිස්ත්‍රික්කයේ දිය ඇලි ආරක්ෂා කර ගැනීමට නොහැකි වෙනවා. පරිසරයට විශාල හානියක් වෙනවා. එහෙම නම් අපි දැන ගන්නට ඕනේ මේ සබරගමුවේ ඉන්න මහජන නියෝජිතයින් 44 දෙනාම මේ යෝජනාව අනුමත කරනවා. මේ විදුලිබලාගාරය වැසිය යුතුයි. මේක තහනම් කළ යුතුයි කියන තැනක මේ අපේ මහජන නියෝජිතයින් 44 දෙනාම ඉන්නවා කියලා මගේ විශ්වාස තියෙනවා. එහෙම නම් ගරු සභාපතිතුමනි අපි හැම දෙනෙක්ම

ඉල්ලුවේ මේක නවත්තන්න ජනාධිපතිතුමා දැනුවත් කරන්න ජනාධිපතිතුමා පරිසරයට ආදරය කරන රාජ්‍ය නායකයෙක් හැටියට අපි දැක්කා අද මාධ්‍යයෙන් අහන්න ලැබුණා. ගම්පහ දිස්ත්‍රික්කයේ අක්කර දහයක් සම්පූර්ණම ගොඩ කරලා කුඹුරු යට කරලා ව්‍යාපාරිකයෙක් ඒවගේ කටයුතු කරද්දී මහජනයින් අවදි වෙලා ජනාධිපතිතුමා දැනුවත් කරලා ජනාධිපතිතුමා නියෝග කරලා තියෙනවා හැම දමපු පස් හැම දෙයක්ම ඉවත් කරන්න ඒ අයට කටයුතු කරන්න කියලා නියෝග කරලා තියෙනවා. අන්න එහෙම නැතක ජනාධිපතිතුමා ඉන්න කොට අපි මේ වගේ අසාධාරණයක් ඉන්න තැනක පරිසරයට හානියක් වෙන තැනක විශේෂයෙන්ම ජනතාවට අසාධාරණයක් වෙන තැනක අපි මේ වගේ ඉදිරිපත් වෙලා කටයුතු කරනවා නම් මං හිතනවා මේවා සම්පූර්ණම නවතා දමන තැනක ගේන්න පුළුවන්කමක් තියෙනවා. එහෙම නම් මගේ යෝජනාවත් ඔබතුමාට යෝජනා කරන්නේ මේ අපේ සභාවේ අදහස් ඔබතුමා ජනාධිපතිතුමා දැනුවත් කරලා මේ කාර්යය ඉටු කර ගන්න ඔබගේ ශක්තිය ධෛර්ය අපිට ලබා දෙන්න කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* Hon.Chairman
*Kanchana Jayarathna* ----------------
-------------------------------------------

ස්තූතියි ගරු විපක්ෂනායක ඩබ්.සෝමදාස මැතිතුමාට. මීළඟට ජී.ඇම්.කරුණාපාල මැතිතුමා. එතුමා සභාවේ නැහැ. මීළඟට රංජිත් බණ්ඩාර මැතිතුමා.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.* *கௌரவ*
*அமைச்சர் ரஞ்ஜித் பண்டார* Hon. Minister
*Ranjith Bandara* -----
-------------------------------------------------

ගරු සභාපතිතුමනි මරුකන්ද එහෙම නැත්නම් සමනල අඩවිකන්ද ජල මූලාශ්‍ර ඉදිකිරීමට යෝජිත විදුලිබලාගාරය සම්බන්ධව මට මතකය හැටියට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා 2015 රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු විශේෂ සභාවට රැස් වූ අවස්ථාවේ මේ යෝජනාවට විරුද්ධව මම අදහස් ප්‍රකාශ කළා. ඒ අදහස් ප්‍රකාශ කිරීමේදී පරිසර පිළිබඳ ගරු අමාත්‍යවරයා හැටියටත් ඒවගේම ජනාධිපතිතුමා හැටියටත් එතුමා පැහැදිලිවම ප්‍රකාශ කළා පරිසරයට හානි වෙන කිසිවකකට මම ඉඩ දෙන්නේ නෑ කියලා. ඉන් අනතුරුව මේ වැඩ සටහන තවත් මහජන නියෝජිතයෝ අදහස් දැක්වූවා. මේ බලාගාරය ඉදි වෙන එක වහාම යටපත් වුණා. නමුත් මේක රබර් බෝලයක් වගේ වතුර යට දාපුවහම හැම වෙලේම ඉලිප්පෙනවා. මේක සැරෙන් සැරේට සැරෙන් සැරේට එනවා. මං හිතන්නේ පළාත් සභාවේ මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් පහුගිය වකවානුවේ දැක්වූවා. ඒවගේම අදත් ඒ විරෝධතාවය දක්වනවා. නමුත් අපිට සැකයක් තියෙනවා අපි කොතෙක් විරුද්ධ වුණත් ඇයි මේක නැවත නැවත එන්නේ. කොහෙන්ද මේක නැවත නැවත එන්නේ. අපි දන්නවා පහුගිය කාලයේ මේ රටේ විදුලිය රත්නපුර දිස්ත්‍රික්කයේ විදුලිබල අමාත්‍යවරු දෙදෙනෙකුත්, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුත් හිටියා. දැන් මේ කාල වකවානුවේ රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්ක දෙකේම අපේ පළාත් සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් හැටියට රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා අද විදුලිබල ඇමතිවරයා හැටියට ඉන්නවා. ඒවගේම අපේ පළාත් විදුලිබල අමාත්‍ය ගරු ප්‍රධාන අමාත්‍යවරයා ඉන්නවා. අද මේ සියල්ලක්ම ඉහළින් යන ක්‍රමවේදයක්

මම දකිනවා. අර විශේෂ අමාත්‍යවරයෙක් හරහා ආවා කියලා මෙතන ප්‍රකාශ වුණා. එහෙම අමාත්‍යවරයෙක් පළාත් සභාවේ නම් නෑ. පාර්ලිමේන්තුවේ විශේෂ ව්‍යාපෘති අමාත්‍යවරයෙක් ඉන්නවා. මේ හරහා ආවා කියලා අපිට දැන් මේ සභාවේ දැන ගන්න ලැබුණා. අපිට විදුලිය මේ රටට අවශ්‍යයි. අප දන්නවා 2017 එහෙම නැත්නම් මේ ලිපියක් තිබෙනවා. ඒ ලිපියේ තිබෙනවා මේ රටේ උත්පාදනය මෙගා වෝට් හාරදාහක් පමණ විදුලි උත්පාදනයක් තමයි තිබෙන්නේ. 2020 වෙන කොට මෙගාවෝට් පන්දාස් තුන්සියයක දක්වා විදුලි උත්පාදනයක් මේ රටට අවශ්‍යයි. ඒවගේම 2025 වෙන කොට මෙගාවෝට් 7500 දක්වා අපි මේ රටේ විදුලි උත්පාදනයට යායුතු වෙනවා. එහෙම නම් අපි මේ විදුලි උත්පාදනය කිරීමේ අවශ්‍යතාවය අපි දකිනවා. හැබැයි මේ රටට විදුලිය අවශ්‍යතාව ය තියෙනවා වගේම මේ රටේ පරිසරය ආරක්ෂා කර ගැනීමේ වගකීමත් මේ රටේ ජනතාවට මහජන නියෝජිතවරු පත් කරන මහජනතාව හැටියට විසින් පත් කළා වූ මහජන නියෝජිතවරුන්ටත් මේකේ වගකීමක් තියෙනවා. එහෙම නම් ගරු සභාපතිතුමනි මේ රටේ අප දන්නවා අපි මේ සෑම දෙයක්ම පිටරට ඩීසල් ටිකෙන් අපි බලශක්ති නිෂ්පාදනය කරනවා. ඒවගේම ප්‍රධාන ජල විදුලිබලාගාර වලින් විදුලිය නිෂ්පාදනය කර ගන්නවා. ඒවගේම මේවගේ ප්‍රාදේශීය මට්ටමින් තිබෙන කුඩා ජල විදුලිබලාගාර වලින් විදුලිය ලබා ගන්නවා. හැබැයි මේ කුඩා විදුලිබලාගාර වලින් ලබා ගන්නවා වූ විදුලිය සඳහා රජය අතිවිශාල මුදලක් මේකට වැය කරනවා. ඒ අයගෙන් මිළදී ගන්නා වූ විදුලිය ඒකකයකට වඩා 30% 35% ක් අඩුනේ තමයි ජනතාවට මේ විදුලිය ලබා දෙන්නේ. එතකොට මේ ඕනම රජයක් මේ විදුලිය මිළදී ගන්නා එකට සහනයක් දෙනවා. එහෙම නම් ඒ සහනය දෙන්නේ කොහොමද මේ රටේ ජනතාවගෙන් එකතු කරන බදු වලින්. ගරු සභාපතිතුමනි මම පෙන්වන්න උත්සාහ කරන්නේ විදුලිය අවශ්‍යයි. ඒ විදුලිය අවශ්‍යතාවයට මේ රට දැන් ලෝකය අනිකුත් රටවල් වගේ විදුලි නිෂ්පාදනය සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග තුළින් අද සූර්යය බලශක්තිය අද මේ රටට හඳුන්වා දීලා අද මේ රටේ ප්‍රතිපත්තියක් බවට පරිවර්තනය වෙලා තියෙනවා. මේ පහුගිය දවසක මේ රටේ අතිගරු ජනාධිපතිතුමාත් ඒවගේම විදුලියබල අමාත්‍යතුමාත් මේ රටේ ආරම්භ කරනවා රාජ්‍ය ආයතනවල සූර්ය බලශක්ති ජාතික වැඩ පිළිවෙලක් ආරම්භ කරනවා. එතකොට මේක හොඳ වැඩක්. අර පරිසරය ආරක්ෂා වෙනවා. අපිට නිකන් ලැබෙන සූර්ය තාපය නිසා අපිට සූර්ය බලශක්තිය ගත හැකිව තිබෙනවා. එතකොට අපි මේ විකල්ප වලට යන්නට ඕනේ. හානියක් නොවන මේ රටේ ජනතාවට හානියක් නොවන විශේෂයෙන්ම මරුකන්ද බලාගාරය බලන්න ඒ ස්ථානයට මමත් පහුගිය දවස් දෙකක ගියා. උත්සෝෂණයක් තිබ්බා. සමහරක් අය ඕනේ කියනවා. සමහරක් අය එපා කියනවා. අපි දන්නේ නෑ එක්. නමුත් ඒ ප්‍රදේශයේ ජනතාවත් එක්ක කතා කළහම ඒ අය කියන්නේ පාරම්පරික ඉඩම් වලින් අපිව අයින් කරලා මොකක්ද මේ හදන සංවර්ධනය. ගරු සභාපතිතුමනි අධිවේගී මාර්ග හැදෙනවා මේ රටේ. ඒ වෙනුවෙන් ජනතාවගේ ඉඩ කඩම් පවරා ගන්න ඒ වෙනුවෙන් ඒ අයට විකල්ප ඉඩම් ලබා දෙනවා. නිවාස හදලා දෙනවා. හැබැයි මේ ව්‍යාපෘතියෙන් අපි දකින්නේ නෑ එහෙම දෙයක්. මේ ව්‍යාපෘතියෙන් අපි දැක්කේ නෑ කිසිම තැනක ඒ පාරම්පරික නිවාසවල අවුරුදු 40,45,50 පදිංචි වෙලා ඉන්න අයට විකල්ප ඉඩමක් ලබාදීමේ හැකියාව එහෙම නැත්නම් නිවාසයක් හදලා දීමේ හැකියාව අවස්ථාව අපි දකින්නේ නෑ. ඒ අය සාමානයයෙන් මේ රටේ කල්ලතෝනි වගේ එළියට දානවා. අපි මේවා අනුමත කරන්නේ නෑ මහජන නියෝජිතවරු හැටියට. ඒ නිසා මගේ දැක්ම තමයි අපිට විදුලිය අවශ්‍යයි. හැබැයි විදුලිය ලබා ගන්න මේ රටේ ජනතාවත් ඉන්න ඕනේ. ජනතාව නැතුව විදුලිය කාටද. එහෙම නම් අපි කල්පනා කරනවා මේ

මරුකන්ද විදුලිබලාගාරය නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා මේ ඉදිරිපත් කරපු යෝජනාව මං හිතන්නේ මේ අවුරුදු දෙක තුළ තුන් හතරවෙනි තැනට ආපු මේ යෝජනාව මං හිතන්නේ මෙතනින් මේක නැවතිය යුතුයි. මම දන්නේ නෑ ඉහළ තලය ක්‍රියාත්මක කරන ආකාරය. පළාත් සභාවේ මන්ත්‍රීතුමාලා මහජන නියෝජිතවරු සියළු දෙනාත් මේකට එකඟ වෙයි. මහජනතාවට පීඩාවට පත් කරන ඕනෑම දෙයක් අපි එක සිතින් අපි සියළු දෙනාම හෙලා දකිනවා කියන ඒ යෝජනාවට අපේ සහාය ලබා දෙමින් ගරු සභාපතිතුමනි ඔබතුමාටත් ඒවගේම පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු මැති ඇමතිතුමන්ලා සියළු දෙනාටත් ,ඒවගෙම අභිනවයෙන් පත් වූ සභා ලේකම්තුමියටත් ,කාර්යය මණ්ඩලය, ඒවගේම මාධ්‍යවේදී මහත්ම මහත්මීන්ටත් සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් සියළු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------

ස්තුතියි ගරු රංජිත් බණ්ඩාර අමාත්‍යතුමාට. මීළඟට පිළිතුරු කතාව කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමාට ආරාධනා කරනවා.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්*
*கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்*
*Hon.Chief Minister Mahipala Herath*
---------------------------------------------

ගරු සභාපතිතුමනි විදුලිබල අර්බුදයට මුවා වී සමනලකන්ද අඩවියේ ජලමූලාශ්‍ර විනාශ මුඛයට ඇද වැටීම . ගරු සභාපතිතුමනි මේ යෝජනාව අතිශයින්ම පාරිසරික වශයෙන් අප පළාතට වැදගත්ම යෝජනාවක් හැටියට මම දකිනවා. මොකද මේ පරිසරය කියන එක අයිති අපිට නෙමෙයි. මේ පරිසරය ස්වභාවධර්මය අයිති අනාගත පරපුරට. අනාගත පරපුරට පරිසරය,ස්වභාවධර්මයත් රැකදීමේ වගකීම තියෙන්නේ වර්තමාන පරම්පරාවේ ඉන්න අපිට. ඒ නිසා මේවා අපි සාකච්ඡා කරලා මේ විදිහට යෝජනා වෙන එක ඉතාමත්ම වැදගත්. අපේ රංජිත් බණ්ඩාර ගරු අමාත්‍යතුමා කිව්වා වගේ විදුලිය අපිට ඉතාමත් අත්‍යාවශ්‍යයි. නව තාක්ෂණ ලෝකයට විදුලිය නැතිවම බැරි යුගයක්. විදුලිය සැපයීම සඳහා ලක්ෂපානෙන් ආරම්භ කරපු මේ ජලවිදුලිබලාගාරය අද විනයක් ඇතිව නිසි පරිදි මේ නිෂ්පාදන බලාගාර හදනවාද කියන එක අපිට ලොකු සැකයක් තියෙනවා. මොකද මේකේ අපේ පළාතේ තමයි සමනළ කන්දේ මෙවැනි ජලමූලාශ්‍ර විශාල ප්‍රමාණයක් ආරම්භ කරලා අද මේ මුළු රටටම ජලය ලබාදීමේ මේ ඉතාමත්ම භාග්‍යවන්ත කර්තව්‍ය සිද්ධ වෙන පළාත. එහෙම නම් මෙවැනි යෝජනාවක් කිරීමේ සම්පූර්ණ අයිතිය සබරගමු පළාතේ ජනතාව වෙනුවෙන් අප පළාත් සභාවට තියෙනවා. ඒ නිසා මේක ඉතාමත්ම වැදගත් යෝජනාවක්. ඒවගේම ජලවිදුලිය පැත්තත් බැලිය යුතුයි. නමුත් පරිසරය දූෂණය නොවෙන ආකාරයට මේවා සිද්ධ වෙනවද කියන එක නිසි පරිදි නීත්‍යානුකූලව අනුමත කරන්නේ අපි නෙමෙයි. අපිට පළාත්

සභාවේ කිසිම අයිතියක් මේ සම්බන්ධයෙන් නෑ. ප්‍රාදේශීය සභාවේ එහෙන් අනුමැතිය ගන්නවා. සමහරවිට පරිසර එකෙන් එහෙන් අනුමැතිය ගන්නවා. වෙනත් විදුලිබල මණ්ඩලයෙන් එවැනි බලපත්‍ර දෙනවා. මේ සියල්ල දීලා අවසාන වශයෙන් මේ නිෂ්පාදනාගාර ඉදිකිරීම් කටයුතු කරන කොට තමයි අපේ ප්‍රදේශයේ ඉන්න අහිංසක ජනතාවට මේ වගේ තියෙන පරිසර හානිය දකින්න පුළුවන් වෙන්නේ. මේ සියළු දෙනාම එකතු වෙලා මේකේ එන්නේ අර හැම කුණු ගොඩක්ම බේරුවල කුණු ගොඩට යනවා වගේ පළාත් සභාවට තමයි ඊළඟට එන්නේ. මේකට ආවට ගරු සභාපතිතුමනි අපිට මේ ගැන තීන්දු තීරණ ගන්නට බැහැ. නමුත් අපේ විරුද්ධත්වය අපිට මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්නට පුළුවන්. ඒක අපි කාටවත් පුද්ගලිකව කරන දෙයක් නොව මම වරක් ගියා බෝපත්ඇල්ල ඒකේ නැවත බෝපත්ඇල්ලේ රෑට ඇල්ල වහලා උදේට වතුර අරිනවා. මේ කෘතීම ඇල්ලක් කරන්න. ඉතිං ඉතිහාසයේ ඒ ඇල්ල දැකපු අය නෙමෙයි උදේ දකින්න හම්බ වෙන ඇල්ල. රෑට එහෙම ඒ ඇල්ල බලන්න බෑ සිරිපාල කිරිඇල්ල අපේ විපක්ෂ සංවිධායකතුමා. පස්සේ අපි ගිහිල්ලා ඔබතුමන්ලා ගිහිල්ලා ඒක අපි කැගහලා ඒක නැවැත්තුවා. ඒක තමයි ජනතා මතය. ඒ නිසා මේ සියළු කාරණා සඳහා ගරු සභාපතිතුමනි අපිට ජනතා මතයක් ගොඩ නගලා අපේ පළාතේ ජනතාවගේ අවශ්‍ය ඉදිරි අනාගත පරපුරට අයිති මේ පරිසරය විනාශ කරනවා නම් අපි සියළු දෙනා එකතු වෙලා මේවා සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි කියන එකයි මගේ අදහස. ඒ නිසා මේ යෝජනාව විශේෂයෙන්ම සමනළකන්දේ මුදුනේ සිට පැන නැගෙන ජලමූලාශ්‍ර ආරක්ෂා කර ගැනීම සඳහා අපි මේ කටයුතු කියන්න අපි බැඳී ඉන්නවා. ඒවගේම අපේ පළාතේ අනාගත පරපුර වෙනුවෙන් මේ කටයුත්ත ඉෂ්ඨ කරන්න සබරගමු පළාතේ අපි හැම කෙනෙක්ම එකතු වෙලා කටයුතු කරමුයි කියන යෝජනාව මම ඉදිරිපත් කරමින් ගරු සභාපතිතුමනි මට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

*ගරු සභාපති කංචන ජයරත්න*

*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*

*Kanchana Jayarathna* ----------------

--------------------------------------------

ස්තුතියි ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමාට. නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා විසින් මෙම සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා අංක 6/1/2016/19 දරණ යෝජනාව ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියළුම ගරු ඇමතිතුමන්ලා,ඇමතිතුමන්ලා සියළු දෙනාගේම අදහස් වලින් ප්‍රකාශ වුනේ මෙම යෝජනාව පිළිබඳව අප්‍රසාදය එළ කරන බවත් ඒවගේම ඊට විරෝධය එළ කරන බවත් තමයි ඒ සභාව තුළින් ඉදිරියට ආපු සාකච්ඡා වලදී දැන ගන්නට ලැබුණේ. ඒ අනුව මේ යෝජනවා මීට වර්ෂයකට පමණ ඉහතදීත් අවස්ථා කීපයකදීත් මේ යෝජනාව මේ සභාව තුළ සාකච්ඡාවට භාජනය වුණා. ඒ අවස්ථාවේදීත් පක්ෂ විපක්ෂ සියළුම ගරු මැති ඇමතිතුමන්ලාගේ එකමතිකවම තීන්දුව වුණේ මේ යෝජනා ක්‍රමයට අවසර ලබාදීම ඉටු නොකළ යුතුයි කියන කාරණාව තමයි. ඒ අනුව වරුණ ලියනගේ ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට මේ යෝජනාව මේ වනවිටත් සබරගමු පළාත් සභාවේ මහජන පෙත්සම් කාරක සභාව තුළ විමර්ශනය කෙරෙමින් ඒ සඳහා ජනතාවගේ ඉල්ලීම අනුව ජනතාව විසින් ඉදිරිපත් කරලා තියෙන යෝජනාව අනුව මේ වනවිටත් සාකච්ඡාවට බඳුන් වෙමින් තියෙන අවස්ථාවක් හැටියට අපි මතක් කරන්නට ඕනේ. ඒවගේම මේ යෝජනාව පිළිබඳව අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා කියාපු ආකාරයට මේ සභාව තුළ මේ සියළු

දෙනාගේම විරෝධය ඒවගේම අප්‍රසාදය එළ කරමින් තමුන්නාන්සේලා ඉල්ලා සිටියේ සබරගමු පළාත පළාත් සභාවක් හැටියට මේ

යෝජනාව පිළිබඳව මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමට අදාල ආයතන වෙත විශේෂයෙන්ම මේ ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතයට බලපාන ආකාරයට ඒ අයගේ විරෝධය ඒ ආකාරයෙන්ම මේ පළාත් සභාවත් අනුමත කරමින් මේ තමුන්නාන්සේලා විසින් ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියළුම ඉදිරිපත් කළ යෝජනා සහ අදහස් වර්තමාන අතිගරු ජනාධිපති ඒවගේම පරිසර අමාත්‍යාංශය භාර ගරු අමාත්‍යවරයා හැටියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් ,ඒවගේම අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් , ඒවගේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සමසභාපතිතුමන්ලාටත් ,ඒවගේම දිස්ත්‍රික් ලේකම්තුමියටත් ,ඒවගේම ඔබතුමන්ලා විසින් ඉල්ලන ලද සියළුම රාජ්‍ය ආයතන වෙතත් මේ යෝජනාව සභාව විසින් තමුන්නාන්සේලාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඉදිරිපත් කල යෝජනාව දන්වා යැවීමට කටයුතු කරන බව මේ ගරු සභාවට දැනුම් දෙනවා.

**සභාව කල් තැබීම:**

මීළඟට සභාව කල් තැබීමේ යෝජනාව ගරු සභානායකතුමා. සමාවෙන්න ගරු හර්ෂ සියඹලාපිටිය මැතිතුමනි. මීළග යෝජනාව තිබෙන්නේ ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2016/20 දරණ යෝජනාව. එතුමා විසින් ඉල්ලීමක් කරලා තියෙනවා එතුමා රෝහල්ගත වෙලා සිටින නිසා ඉදිරි දිනයකදී ඒ යෝජනාව සාකච්ඡාවට ගන්න නිසා , මේ යෝජනාව ඉදිරි දිනයකදී සාකච්ඡාවට ගන්න බව මේ ගරු සභාවට දැනුම් දෙනවා. මීළඟට සභාව කල් තැබීමේ යෝජනාව.

*ගරු ආ.ප.සංවිධායක හර්ෂ සියඹලාපිටිය*
*கௌரவ அரச.க.அமைப்பாளர் ஹர்ஷ சியம்பலாபிடிய* *Hon.Gov.Whip Harsha Siyambalapitiya* --------------
-----------------------------------------

ගරු සභාපතිතුමනි 2017 ජනවාරි මස 24 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන්න යෝජනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ---------------
-----------------------------------------

ස්තුතියි ගරු ආණ්ඩු පක්ෂ සංවිධායකතුමනි. මීළඟට සභාව කල් තැබීමෙන් පසු ගරු අමාත්‍ය අතුල කුමාර රාහුබද්ධ මැතිතුමා.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා:**

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ*
*அமைச்சர் அதுல குமார ராஹூபத்த* *Hon. Minister*
*Athula Kumara Rahubadda*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි විශේෂ ස්තුතියක් කිරීම සඳහා ඔබතුමාගෙන් වෙලාව ලබාදීම පිළිබඳව සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ පළාත් සභාවේ සභාලේකම්වරයා හැටියට

කටයුතු කරලා කාලාන්තරයක් ඔබතුමාට විශාල ශක්තියක් ,ඒවගේම සභාවේ කටයුතු වලට ඔබතුමාට විශාල මහ පෙන්වීමක් ලබාදීපු අපේ සභාලේකම්තුමා පාලිත නානායක්කාර මහත්මයා මේ අවස්ථාවේ

සභා ලේකම් ධූරයෙන් ඉවත් වෙලා වෙනත් අමාත්‍යාංශයකට ගියා. එතුමා කරපු සේවය ඔබතුමාට දුන්නු සහයෝගය විශේෂයෙන් සභාවට දීපු කටයුතු ටිකට සහයෝගය වශයෙන් ගරු සභාවේ මැති ඇමතිවරු පක්ෂ විපක්ෂ අපි සියළු දෙනාගේ ගෞරවය මේ වෙලාවේ පිරි නමනවා. ඒවගේම ඒ කාර්යය භාරය ඉදිරියට කරගෙන යන්නට විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම්වරයා ඒ වගේම තැපැල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරියක් විදිහටත් අද සබරගමු පළාත් සභාවේ සභාලේකම්තුමිය විදිහට විශාල අත්දැකීම් රාශියක් ඇති ලේකම්තුමියටත් මේ සභාවේ කටයුතු ඒ ආකාරයට කරගෙන යන්නට ශක්තිය ධෛරය ප්‍රාර්ථනා කරමින් අද ඔබතුමා මේ සියළු දෙනා බලාපොරොත්තු වෙච්චි සබරගමුවේ වෙබ් සයිට් එක අද ආරම්භ කළා. ඒ වෙනුවෙන් කැප වුණු ඔබතුමා ඇතුළු විශේෂයෙන් සහකාර ලේකම්තුමිය සමේධානී මාතරහේවගේ මැතිණියටත් අපේ ගෞරවය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒවගේම ගරු සභාපතිතුමනි ඔබතුමා ඇතුළු සියළුම මැති ඇමතිවරුන්ටත් ඒවගේම විපක්ෂ නායකතුමා ප්‍රමුඛ විපක්ෂයේ මැති ඇමතිවරුන්ටත් ,සභාලේකම්තුමිය ප්‍රමුඛ නිළධාරීන්ටත් , මාධ්‍ය නිළධාරීන්ටත් ලැබුවා වූ 2017 නව වර්ෂය සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

ස්තූතියි ගරු අමාත්‍ය අතුල කුමාර රාහුබද්ධ මැතිතුමනි.

මීළඟට සභාව කල් තැබීමෙන් පසු යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආරියවංශ බාලසූරිය මැතිතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී බී.ආරියවංශ* *கௌரவ*
*உறுப்பினர் பீ.ஆரியவங்ஷ* *Hon.Member*
*B.Ariyawansha* ----------
----------------------------------

ගරු සභාපතිතුමනි සභාව කල් තබන අවස්ථාවේ යෝජනා වශයෙන් මම ඇඹිලිපිටිය ආයුර්වේද රෝහලේ අඩුපාඩු රාශියක් පිළිබඳව දැනුම්දීමටයි. මේ වෙන කොට රෝහලේ විශාල රෝගීන් ප්‍රමාණයක් ප්‍රතිකාර ලබනවා සෑම මසකම රෝගීන් 100 ට අධික ප්‍රමාණයක් මේ රෝහලෙන් ප්‍රතිකාර ලබනවා. ඒ නිසා මේ රෝහලේ මේ වෙන කොට පිරිමි වාට්ටුවේ වැසිකිලි පද්ධතිය ඉතාම අබලන් තත්ත්වයේ තියෙන්නේ. මොකද මහවැලි අධිකාරියේ ඉඩම නිරවුල් කිරීම යටතේ කම්බි ගැසීමෙන් ඒ වැසිකිලි පද්ධතියට ගලි බවුසරයක් යාමට බැරි තත්ත්වයක් තමයි මේ වෙන කොට උදා වෙලා තියෙන්නේ. ඒවගේම තමයි මේ වෙන කොට දිරා පත් වෙලා කැඩිලා විශාල දුර්ගන්ධයක් හමනවා. ඒ රෝගින්ට ඒ ප්‍රතිකාර ගැනීමේදී ඉතාම අපහසුතාවයට පත් වෙලා තියෙනවා ගරු සභාපතිතුමනි. ඒවගේම තමයි මුලුතැන්ගෙයි හා ඖෂධාගාරයේ හා වාට්ටු වලින් බැහැර කරන අපිරිසිදු ජලය මහවැලි ඉඩමට බැහැර කිරීමේ කටයුත්ත තමයි මේ වෙන කොට සිදු වෙන්නේ. එම නිසා මේ සියළු දේවල් මේ අපද්‍රව්‍ය බැහැර කරන්න වලක් සකස් කර

ගැනීමේ අවශ්‍යතාවය තියෙනවා. ඒවගේම තමයි මේ රෝහලේ විශාල රෝගීන් ප්‍රමාණයක් සිටිනවා. ඒ නිසා මේ වෙන කොට කාර්යය මණ්ඩලයේ කණිෂ්ඨ සේවකයින්ගේ විශාල පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙනවා. මේ සියල්ලක්ම සංවර්ධනය

කිරීමේදී විශාල ගැටළුවකට පත් වෙලා තිබෙනවා. මේ වනවිට නව වාට්ටු සංකීර්ණයක් ගිය වර්ෂයේදී ආරම්භ කළත් ඒ වාට්ටු සංකීර්ණය මේ වනවිට සංවර්ධනය කරගෙන යනවා. ගොඩනැගිලි ඉදිකරමින් යනවා. මේකට තව වසර දෙකක් පමණ යනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මම ඉල්ලා සිටිනවා කඩිනමින් මෙම වැසිකිලි පද්ධතියත් ඒ කුණු බැහැර කරන්න ඒ කසල බැහැර කරන්න ස්ථානයකුත් සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒවගේම ගරු සභාපතිතුමනි 2017 ලැබුවා වූ නව වසර ගරු සභාපතිතුමාටත් ඒවගේම ප්‍රධාන ඇමතිතුමා ඇතුළු සියළුම අමාත්‍යතුමාලාටත් ඒවගේම විපක්ෂනායකතුමා ඇතුළු විපක්ෂයේ සංවිධායකතුමාටත් සියළුම මන්ත්‍රීතුමන්ලාටත් ඒවගේම නව ලේකම්තුමියටත් ඒවගේම ඒ කාර්යය මණ්ඩලයටත් ඒවගේම සබරගමු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියළුම නිළධාරීන්ටත් 2017 වසර සාමය,සතුට පිරි සුභ නව වසරක් වේවා යැයි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* Hon.Chairman
*Kanchana Jayarathna*
----------------

ස්තූතියි ගරු ආරියවංශ බාලසූරිය මන්ත්‍රීතුමනි. මීළගට කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක* கௌரவ
*உறுப்பினர் கே.எல்.ரத்நாயக* Hon.Member
*K.L.Ratnayake*
--------------

ගරු සභාපතිතුමනි සබරගමුව නැටුම් පර්යේෂණ හා පුහුණු ආයතනය උසස් ඩිප්ලෝමාධාරීන් ශ්‍රීලංකා ගරු සේවයට බඳවා ගැනීම පිළිබඳව. ගරු සභාපතිතුමනි සබරගමුව විශ්ව විද්‍යාලය වෙනුවෙනුත් මේ වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙනවා මේ සියළු කාරණා තියෙනවා ගරු සභාපතිතුමනි. හැබැයි මේ කණ්ඩායමේ ඉන්නේ 48 දෙනයි. 2008-2011 කණ්ඩායම. 2009-2012 කණ්ඩායම. මේ ඔක්කෝම ඉන්නේ 48 දෙනයි ගරු සභාපතිතුමනි. එතකොට මේ පළාත් සභාව මගින් මුදල් වියදම් කරලා තියෙනවා. මේ පළාත් සභාව පිළිඅරගෙන ප්‍රධාන අමාත්‍යාංශය කටයුතු කරලා තියෙනවා. මං හිතන්නේ ඔබතුමා ඒක දන්නවා. විෂයධාර අමාත්‍යතුමා මෙතන නෑ. මම විෂයභාර අමාත්‍යතුමාත් එක්ක කතා කළහම කිව්වේ කමිටු වාර්තාව ආවහම මේ 48 දෙනා ගන්න කටයුතු කරනවා කියලා. මේ වෙන කොට මේ වාර්තාව ඉසුරුපායට ගියෝත් එහෙම මේක නම් අනුමත වෙලා එන්නේ නෑ. සම්මජ්ජාතියට. මොකද මෙ වාර්තාව අනුමත කරලා තියෙන්නේ අපේ ලේකම්තුමා ප්‍රදාන කණ්ඩායම. මේ තියෙන වාර්තාව අනුව ඉසුරුපායට දැම්මොත් එහෙම මේක කිසිසේත් අනුමත වෙන්නේ නෑ ගරු සභාපතිතුමනි. මෙකෙදි මේ තියෙන කාරණා කියන්න මට වෙලාවක් නෑ. සබරගමුව නර්තන ශිල්පී පී.අබේරත්න මහත්තයාගෙන් තමයි මේක මෙහෙයව

ගෙන තියෙන්නේ. ඊට පස්සේ කෑගල්ල හා රත්නපුර මධ්‍යස්ථාන දෙකක අධ්‍යාපන කටයුතු ආරම්භ කරලා තියෙනවා. ඉන් පසුව ඇහැලියගොඩ පනාවල ගුරු ගෙදර ස්ථානයේ නැවත ආරම්භ කරලා තියෙනවා 2007.05.17 වෙනි දින. සබරගමු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයටත් විභාග පැවැත්වීම සඳහා සබරගමුව විශ්ව විද්‍යාලයටත් පවරලා තියෙනවා ගරු සභාපතිතුමනි. මේකෙදී මේ සියල්ල කරගෙන යන කොට පළාත් සභාව මගින් මේ පූර්ව සේවාව මාඨමාලාවක් ලෙස පවත්වාගෙන ගොස් තිබෙනවා ගරු සභාපතිතුමනි. උපදේශක ගාස්තු විභාග ගාස්තු මේ සියල්ලක්ම වියදම් කරලා තියෙනවා. පන් ලක්ෂ අනූඅටදාස් හතළිහක් වියදම් කරලා තියෙනවා 2007 වර්ෂයේ. ඊට එහා වර්ෂවල අට ලක්ෂ හතළිස්දාහයි. නව ලක්ෂ අසූ තුන් දාහයි. ඊට පස්සේ එක්ලක්ෂ දහතුන්දාස් හයසීයයි. මේවගේ දාලා තියෙනවා දහතුන් ලක්ෂයක් වියදම් කරලා. මේ දරුවන්. ඊට පස්සේ කියනවා මේ වාර්තාවේ දැන් බඳවා ගන්න මේකේ විශ්වාසයක් නෑ කියනවා. මාර කතාවක්නේ. මේ පළාත් සභාව විසින් ඕන තරම් මුදල් අනිසි දේවල් වලට කතා කරන අවස්ථාවල් තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ දරුවෝ පාඨමාලාවල් හදාරලා තියෙනවා. මගේ හිතේ කමිටු වාර්තාවල් ගන්න මාස දෙක තුනක් ගියා. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි ඉල්ලීමක් කරන්නේ මේ 48 දෙනා බඳවා ගන්න අවශ්‍ය කටයුතු කරන්න නම් ඉසුරුපායේ අනුමැතිය අවශ්‍යයි. හැබැයි මේ කමිටු වාර්තාව අහපුවහම නම් මේකට අනුමැතියක් නම් හම්බ වෙන්නේ නෑ. මේ වාර්තාව ඒ දරුවෝ පිළිගන්නේත් නෑ. මම දන්නේ නෑ මොන ආකාරයට ක්‍රියාත්මක කළාද කියලා. ඕනම සමාජයේ ඉන්න දරුවෙක් ඉගෙන ගෙන රැකියාවක් බලාපොරොත්තුවෙන්

තමයි ගමන් කරන්නේ. හැබැයි මෙතන ඉන්න අපේ නිළධාරී මහත්තුරු වෙන්න පුළුවන්. ඔබතුමා ඇතුළු අපි පක්ෂ භේදයෙන් තොරව ඉන්න පුළුවන්. හැබැයි මේ අපි ගියත් එන කණ්ඩායමට මේ පළාත් සභාව රැකලා තියන්න ඕනේ. ඒවගේම තමයි මේ නිළධාරී මහත්තුරුත් මේ වාර්තාව ඉදිරිපත් කරන කොට මේක කෙරෙන විදිහකට අවශ්‍ය වාර්තාවක් ලබා දුන්නා නම් තමයි මේකේ හොඳ. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ දරුවෝ රවට්ටන්නේ නැතුව ඒ දරුවෝ මේ නර්තනය ඉගෙන තියෙන්නේ පාරම්පරිකව සහ අනිකුත් සබරගමු නර්තන සියල්ලම ඉගෙන ගෙන තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මේකේ විශේෂ අවධානයක් යොමු කරලා නැවත වරක් මේ පළාත් සභාවේ කතා කරන්න නොතබන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා ගරු සභාපතිතුමනි. ඊට පස්සේ මේකේ අන්තිමට වාර්තාවේ කියනවා ගිරාගම සෞන්දර්ය ගුරු අධ්‍යාපන විද්‍යාලය වැනි ආයතනයක දෑඅවුරුදු පුහුණුවෙන් පසු ශ්‍රීලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහනය කළ හැකි බව යෝජනා කරමි. මම මේක සභාගත කරනවා ගරු සභාපතිතුමනි. මෙය විශේෂ අවධානය යොමු කරලා අපේ ප්‍රධාන අමාත්‍යතුමා විෂයභාර අමාත්‍යතුමාත් එක්ක සාකච්ඡා කරලා මේ පළාත් සභාවේ වියදම් කරලා තියෙන ඒවාත් එක්ක බැලුවහම ඒ වියදම්කළාට අපරාදයක් වෙන්නේ නෑ මේ දරුවන්ට ඒ වියදම් කළාට. අපි මේ නර්තනය රැක ගන්න සබරගමු සම්ප්‍රදාය රැක ගන්න ඕනේ. පාරම්පරික නර්තනය රැක ගන්න ඕනේ. එහෙම නම් මේ අයට මේ පුහුණුව ලබලා තියෙන දරුවන්ට මේ දරුවන්ට බොරු පොරොන්දු නොදී කෙරෙන ආකාරයට මේ වාර්තාව ඉසුරුපායට යවන්නේ නැතුව වෙන වාර්තාවක් කෙරෙන විදිහට වාර්තාවක්

සකස් කරන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරමින් ඒ දරුවෝ රවට්ටන්න එපා කියන ඒ ගෞරවනීය ඉල්ලීමත් කරනවා ගරු සභාපතිතුමනි. ස්තූතියි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

ස්තූතියි ගරු කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමාට. ඉතාමත් අත්‍යාවශ්‍ය වූ යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව. ගරු අධ්‍යාපන අමාත්‍යතුමා හරහා ප්‍රධාන මැදිහත්වීම් කිරීමට කටයුතු කරන බව දැනුම් දෙනවා. මීළගට ගරු නිහාල් ෆාරුක් ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්*
*கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்* *Hon.Member*
*Nihal Farook* ----
----------------------------------------

ගරු සභාපතිතුමනි විශේෂයෙන්ම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ දෙහිඕවිට කලාපයේ දෙහිඕවිට දෙමළ විද්‍යාලයේ පහුගිය දා ඇති වුණු ගංවතුර සහ නායයෑම් හේතුවෙන් මේ වනවිට එම පාසැලේ කටයුතු සිද්ධ කරන්නේ නෑ. දෙවනුව ඒ දරුවන්ට දෙහිඕවිට ජාතික පාසැලේ දෙකෙන් පස්සේ තමයි ඒ දරුවන්ට ඒ පාසැලේ අධ්‍යාපනය කරන්න අවස්ථාව ලබා දීලා තියෙන්නේ. මොකද පරණ ඒ පාසැලේ ගොඩනැගිල්ල මේ වනවිට නාය යෑමට ලක් වෙලා තිබෙන නිසා එතන අධ්‍යාපන කටයුතු සිද්ධ කරන්නට බැහැ. දිගින් දිගටම මේ පිළිබඳව මාධ්‍යය තුළිනුත් ගියා. මං හිතන්නේ පළාත් සභාවට අයිති පාසැලක් නිසා පළාත් සභාවටම ලොකු හානියක් මේ නිසා හැකි ඉක්මනින් දරුවන්ට අලුත් ස්ථානයක් ඉඩමක් දේවාලකන්ද වත්ත ප්‍රදේශයේ බලනවා.

ඒක තාමත් ස්ථිරව ගොඩනැගිල්ලක් හදා ගන්න ඉඩමක් වෙන් වෙලා නැහැ. ඒ නිසා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කඩිනමින් මේ දරුවන්ට අධ්‍යාපන කටයුතු කරගෙන යන්නට හවස් වරුවේ පැය තුන හතරයි ඒ ළමයින්ට අධ්‍යාපනය ලබා ගන්න අවස්ථාව ලැබෙන්නේ. මේ පාසැල තුළ ඔවුන්ගේ මානසිකත්වය වැටෙනවා. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරලා කඩිනමින් ඒ දරුවන්ට වෙනත් ස්ථානයක හෝ තිබෙන ස්ථානයේ හරියට ගොඩනැගිලි හා පර්යේෂණායනයේ පරීක්ෂා කර බලලා එතන සුදුසු නම් එතනවත් යලිත් වතාවක් ඒ පාසැල කරගෙන යන්නට අවස්ථාව සලසා දෙන ලෙස ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒවගේම උදා වූ නව වසර ඔබතුමා ඇතුළු කාර්යය මණ්ඩලයට ඒවගේම ප්‍රධාන ඇමතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට අපේ ලේකම්තුමිය ඇතුළු සියළුම සභා ලේකම් කාර්යාලයේ සියළු දෙනාටත් සුහම සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman*
*Kanchana Jayarathna* ----------------
--------------------------------------------

ස්තුතියි ගරු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමාට. දැන් වෙලාව මධ්‍යාහ්න 12.16 යි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී අතුල කුමාර රාහුබද්ධ අමාත්‍යතුමා ඉදිරිපත් කලා වගේම අපේ පළාත් සභාවේ සභා ලේකම්වරයා වශයෙන් මෙතෙක් කටයුතු කළ පාලිත නානායක්කාර මැතිතුමා දීර්ඝ කාලයක් සභාලේකම්වරයා හැටියට එතුමාට සේවය කරන්නට අවස්ථාව නොලැබුණා වුණත් එතුමා රාජකාරී කළ කෙටි කාල සීමාව තුළ දී ඉතාමත් දක්ෂ ඉතාමත් ශක්තිමත්, ඉතාමත් නිර්මාණශීලී ලේකම්වරයෙක් විදිහට විශේෂයෙන්ම සභාපතිවරයා හැටියට මේ කටයුතු නිරවුල්ව නිර්මානශීලීව ඉස්සරහට අරගෙන යන්නට ලොකු දායකත්වයක් ලොකු ශක්තියක් ලබා දුන්නා. එතුමාට වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ වෙනත් ස්ථානයකට මාරු වෙලා යන්නට අවස්ථාව ලැබිලා තියෙනවා. කෙසේ වෙතත් අපි එතුමාට සුභ පතනවා එතුමාගේ ඉදිරි කටයුතු සාර්ථක වේවා වගේම , අපි ස්තුතිවන්ත වෙනවා එතුමා සභාපතිවරයා හැටියට මටත් ඒවගේම තමුන්නාන්සේලා සියළු දෙනාටමත් මේ සභාව ඉතාමත් වැදගත් ආකාරයට සභාලේකම්වරයා හැටියට ඒ වගකීම් හරියාකාරව ඉෂ්ඨ කරමින් ඉස්සරහට අරගෙන යන්නට ලබා දුන් සහයෝගයට අපේ ස්තුතියි අපි මේ අවස්ථාවේදී පුද කරනවා. ඒවගේම අභිනවයෙන් මේ සභා ලේකම්වරයා හැටියට වැඩ භාර ගන්නා ලද රාජ්‍ය සේවයේ දීර්ඝ කාලයක් අත්දැකීම් එළපුරුදු තියෙන ඒවගේම විනයානුකූලව ඒවගේම නිර්මාණශීලීව ඒවගේම ඉතාම කැපවීමකින් තම රාජකාරිය ඉෂ්ඨ කරන අලුතින් තේරී පත් වෙලා ආපු විජයරාජ අපේ ගරු ලේකම්තුමියත් මේ අවස්ථාවේදී අපි ඉතාම ගෞරවයෙන් පිළිගනිමින් එතුමියට එතුමියගේ කටයුතු ඉතාම සාර්ථකව ඉදිරියට කරගෙන යන්නට ශක්තිය,ධෛරය වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒවගේම ගරු ආණ්ඩුකාරතුමාටත් ඒවගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් ඒවගේම ගරු ඇමතිතුමන්ලා විපක්ෂනායකතුමා ඒවගේම ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියළුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියටත් ඒවගේම ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියළුම පළාත් සභාවේ කාර්යය මණ්ඩලයටත් ඒවගේම අපේ ආදරණීය මාධ්‍යවේදී සොයුරන්ටත් සියව දෙනාටත් ලැබුවා වූ 2017 අවුරුද්ද සියළු බලාපොරොත්තු ඉෂ්ඨ වෙන සුභම සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් අද දිනට මෙම ගරු සභවේ වැඩ කටයුතු අවසන් කරනවා. මෙම ගරු සභාව 2017 ජනවාරි මස 24 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

අත්/කළේ:
කංචන ජයරත්න,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017.01.18 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.